# කාර්ය පත්‍රිකා සංග්‍රහය - 2021

# නර්තනය

## 8 ශ්‍රේණිය



නර්තන ගුරු සංසදය

කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර.

**08 ශ්‍රේණිය** පටුන


| ක්‍රියාකාරකම් අංක | ක්‍රියාකාරකම | පිටු අංකය |
| --- | --- | --- |
| **1 වන වාරය** | | |
| 2.1 | නම්‍යතා අභ්‍යාසයේ යෙදෙමු | 01-04 |
| 1.1 | නර්තන මාධ්‍යයෙන් සත්ත්ව චරිත නිරූපණය කරමු | 05-08 |
| 2.2 | නර්තනයට පාද හුරු කර ගනිමු(පා සරඹ) | 09-12 |
| 2.3 | නර්තනයට හස්ත හා පාද හුරු කර ගනිමු(ගොඩ සරඹ) | 13-16 |
| 2.4 | බෙර හඬ මැද්දේ නටමු පද සිත් සේ | 17-20 |
| 4.2 | ජන ගායනාවල සමාජයීය හා සංස්කෘතික පසුබිම හඳුනාගනිමු | 21-23 |
| 2.5.1 | වන්නම් ගයමින් නටමු | 24-26 |
| **2 වන වාරය** | | |
| 1.3 | පතුරු/ සවරම් නැටුම නිර්මාණය කරමු | 27-29 |
| 3.1 | පහතරට බෙරය පිළිබඳ තොරතුරු විමසමු | 30-31 |
| 3.2 | සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය කරමු | 32-33 |
| 2.5.2 | වන්නම ගයමින් නටමු | 34-36 |
| 5.1 | නර්තන කලාව හා සබැඳි මූලාශ්‍රය හඳුනාගනිමු | 37-40 |
| 6.3 | නවරාත්‍රී උත්සවය හඳුනාගනිමු | 41-42 |
| 2.6.2 | නිර්දේශිත කවි හා පද ප්‍රස්තාර කරමු | 43-46 |
| 2.6.1 | අදාළ කොටස් ප්‍රස්තාර කරමු | 47-48 |
| **3 වන වාරය** | | |
| 1.2 | භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරමු | 49-50 |
| 5.2 | ශාන්තිකර්ම හඳුනාගනිමු | 51-54 |
| 5.3 | නර්තන ශිල්පීන් අගයමු | 55-59 |
| 6.1 | මහනුවර දළදා පෙරහර අසිරිය | 60-64 |
| 6.2 | භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදාය හඳුනාගනිමු | 65-68 |
| 7.1 | ගීතයේ පසුබිම හඳුනාගනිමු | 69-71 |

නර්තනය

8 ශ්‍රේණිය. 1 - වාරය

ගුරුභවතාගේ නම : H.M. නදීකා ශිරෝමි අම්/සේනාගම මහ විද්‍යාලය

නිපුණතාව : 2.0 නර්තනය හා බැඳුණු මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.1 ශාරීරික නම්‍යතාව සඳහා නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරයි.

## නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරමු

### නම්‍යතා අභ්‍යාස යනු :-

නර්තනයේ දී අපට අවශ්‍ය සමබරතාවය , සැහැල්ලුව , දරා ගැනීම , ඉරියව් පෑම ආදිය නිවැරදිව කර ගැනීම සඳහා සිදු කරන අභ්‍යාස නම්‍යතා අභ්‍යාස වේ.

මෙම අභ්‍යාස ,

1. සංචාරී චලන හා ස්ථිතික චලන ලෙස මෙම චලනයන් ක්‍රියාකාරකම් නිර්මාණයේ දී භාවිතා කළ හැක





එක් පාදයකින් සිටගෙන අනෙක් පාදයේ දණහිස කොටස දෑතේ ඇඟිලි වලින් අල්ලා නවා ගනිමින් ශරීරයේ සමබරතාවය තබා ගනිමින් අභ්‍යාසයේ යෙදෙන්න.



දණ හිස නොනැවෙන ආකාරයෙන් සිට දෑතම පොළවට තබා නම්‍යශීලී බව රැකගන්න.





දෑත් ඔසවා විලුඹ මත වාඩි වී දකුණු කකුල දිග හැර සිට නැවත විලුඹ මත වාඩි වන ඉරියව්වට පැමිණීම.

මෙය දකුණු සහ වමට සමානව අභ්‍යාස කරන්න.









මෙහිදී දෑත් සහ පාදයේ සමබරතාවය රකිමින් නම්‍යශීලී අභ්‍යාසයේ යෙදෙන්න.

මෙවන් අන්දමට ඉරියව් වෙනස් කරමින් අභ්‍යාසයේ නිරත වන්න. ස්ථිතික චලන පමණක් නොව සංචාරී චලන ද යොදා ගනිමින් ක්‍රියාකාරකම් කල හැක. ඒ සදහා ඔබේ උත්සාහය වැදගත් වේ.

මෙම චලන අභ්‍යාස කිරීමේ දී තාලම්පට , බෙර පද , සංගීත ඛණ්ඩ යොදා ගත හැක.

උදාහරණ - කුඳ ගත ගත දොම් (2+2)

ජිංකඩතක ජිං කුකුතක (3+3)

දොදොංත තකුදොං (4+4)

(නිර්මාණාත්මක බෙර පද යොදා ගැනීම , සංගීත ඛණ්ඩ හා තාලම්පට යොදා ගැනීම මඟින් ඔබට අවශ්‍ය සුදුසු ආකාරයකට නම්‍යතා අභ්‍යාස සිදු කළ හැක.)




<u>නමත්‍යතා අභ්‍යාස කිරීමේ වැදගත් කම හා ප්‍රයෝජන,</u>

1. නර්තනයට අවශ්‍ය ඉරියවු (හැඩතල) නිවැරදි කර ගැනීම.
2. යහපත් සෞඛ්‍ය සම්පන්න නීරෝගී පුද්ගලයෙකු වීම.
3. ප්‍රීතිමත්ව , නමත්‍යතා අභ්‍යාස වල යෙදීම නිසා මානසික සුවයක් ඇතිවීම
4. අභියෝගවලට මුහුණ දීම හා දරා ගැනීමේ හැකියාව ඇති වීම.
5. ශාරීරික ප්‍රසන්න බව ඇති වීම.
6. කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වීම.
7. නර්තනයට උචිත කායික වර්ධනයක් ඇති වීම.
8. නර්තනයේ දී ශරීරයේ අඟපසඟ නමත්‍යශීලීව හා අලංකාරව චලනය කිරීම.
9. පුද්ගල හා පොදු අවකාශය ප්‍රයෝජනයට ගනිමින් නිදහස් චලන ක්‍රියාකාරකම් කළ හැකි වීම.
10. අභ්‍යාස සිදු කිරීමේ දී පුද්ගල මානසික හා කායික ශක්තීන් වර්ධනය වීම.
11. තම ශරීර ඉන්ද්‍රියන් සැහැල්ලුවෙන් හැසිරවීමට අවශ්‍ය කුසලතා වර්ධනය වීම.
12. සමබරතාව පවත්වා ගනිමින් තාල , රිද්මයට අනුව අංග , ප්‍රත්‍යංග , උපාංග හැසිරවීමට හැකි වීම.

කාර්ය පත්‍රිකාව

1. පුද්ගලයෙකුට තම ශරීරය නිසිලෙස පවත්වා ගෙන යාම සඳහා................... කිරීම වැදගත් වේ.

2. නර්තනයට අවශ්‍ය සමබරතාව...................... හා ......................... හා .......................
ඉරියව් නම්‍යතා අභ්‍යාසයට උපකාරී වේ.

3. නම්‍යතා අභ්‍යාස සඳහා ඉදිරිපත් කරන චලන වර්ග ලෙස ............................. හා
..................... හැඳින්වේ.

4. ස්ථිතික චලනයකි ..........................

5. නර්තනයට පෙර නම්‍යතා අභ්‍යාස කිරීමේ දී ඒ තුළින් ......................... වර්ධනය වේ.

6. නම්‍යතා අභ්‍යාස යනු කුමක් ද?

7. නම්‍යතා අභ්‍යාස කිරීමෙන් නර්තනයට හා ශාරීරික සුවතාවට ඉවහල් වන අයුරු පිළිබඳව විස්තර කරන්න.

8. නම්‍යතා අභ්‍යාස තුළින් යහපත් දිවිපැවැත්මකට ලැබෙන පිටුවහල පිළිබඳ කරුණු 5 ක් ලියා දක්වන්න.

9. නම්‍යතා අභ්‍යාස කළ හැකි බෙර පදයක් සඳහන් කර එහි තිත් මාත්‍රය ද නම් කරන්න.

10. කණ්ඩායම් හා ඒකල වශයෙන් අභ්‍යාස පුහුණුවීම් කර ඉදිරිපත් කරන්න.

නර්තනය

8 ශ්‍රේණිය. 1 - වාරය

ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.සුරංගා කසුන්මාලි අම්/පාදාගොඩ විද්‍යාලය

නිපුණතාව: 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම: 1.1 ස්වභාවික පරිසරයෙන් හඳුනාගත් සත්ත්ව චර්යා ඇසුරෙන් නර්තන නිර්මාණ කරයි.

## නර්තන මාධ්‍යයෙන් විවිධ සත්ත්ව චරිත නිරූපණය

පරිසරයෙහි අප දකින සෑම සතෙකුගේම හැසිරීම එක හා සමාන නොවේ.එකිනෙක සතාගේ ගමන් විලාසය, ආහාර ගැනීමේ ස්වරූපය, විවිධ අවස්ථාවල දී එකී සතුන් දක්වන චර්යා එකී සතුන්ටම ආවේණික වූ ආකාරයක් ගනී. කිසියම් සතෙකුගේ චර්යා අනුකරණය කරමින් එය නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන්නට නම්, එම සතා බාහිර වශයෙන් පෙන්නුම් කරන ක්‍රියාකාරකම් හඳුනා ගත යුතුය.

සතෙකු පිළිබඳව කරනු ලබන නිරීක්ෂණයක දී, එකී සත්ත්වයාගේ ගමන් විලාසය,



- සාමාන්‍ය ගමන
- බිය වූ විට දුවන ආකාරය
- කෝපයට පත් වූ විට ගමන් කරන ආකාරය

පහර කා හෝ වෙනත් ආකාරයකින් පීඩාවට පත් වූ විට එතැනින් ඉවත් වී යන ගමන් ස්වරූපය යන අවස්ථා නිරීක්ෂණය කර එක්නෙක අවස්ථාවේ දී දක්වන විශේෂත්වය හඳුනා ගත යුතුය.

ආහාර ගන්නා ආකාරය,

- තමා සොයා ගත් ආහාරයක් කන ආකාරය
- වෙනත් කෙනෙකුගේ ආහාරයක් උදුරාගෙන කන ආකාරය
- සමූහය සමඟ ගැවසෙන ආකාරය
- කුසගිනි ඇති කල හැසිරෙන ආකාරය
- නිදාගන්නා ආකාරය
- කූඩුවක හා නිදහසේ සිටින විට දක්වන චර්යා
- කෝප වූ විට හෝ නොසන්සුන් වූ විට දක්වන චර්යා



යනාදී වශයෙන් විවිධ අවස්ථාවන් නිරීක්ෂණය කළ යුතුය. කිසියම් සතෙකුගේ චරිතයක් අපට නිර්මාණය කර පෙන්වීමට අවශ්‍ය අවස්ථාවක දී අප නිරීක්ෂණ මඟින් ඉගෙන ගත් සියල්ල අතිශයින් ම ප්‍රයෝජනවත් වෙයි. මෙම පාඩමේ දී අලියා, සිංහයා, අශ්වයා, මොනරා, උකුස්සා, හා කුකුළා වැනි සතුන්ගේ චරිත නිරූපණය කර පෙන්වීමට හැකි විය යුතුය. පෙර සඳහන් කරන ලද ආකාරයෙන් සතුන්ගේ හැසිරීම් රටාව නිරීක්ෂණය කළ යුතුය. ඇතැම් සතුන් අප අවට පරිසරයේ දක්නට නැත. එසේ නොමැති අවස්ථාවක දී සතුන් නිරීක්ෂණය කළ හැකි පරිසරයකට යා යුතුයි.

**චර්යා රටාව** **සත්ත්වයා**




- සෙමෙන් අඩි තබමින් ගමන් කරයි. පාද ඔසවන්නේ මද
- වශයෙනි.
- ගමනේ දී කන් දෙක ඉදිරියටත් පිටුපසටත් සැලීම
- හොඬවැල උපයෝගී කරගෙන ආහාර ගැනීම
- දිය නාන අවස්ථාව
- අලි දෙදෙනෙකු සටන් කිරීමේ දී හොඬවැල ඔසවා හිස් එකට තද කර තල්ලු කිරීම, කේන්ති ගිය විට හොඬ උඩට ඔසවා හකුළා මහත් ශබ්දයෙන් කෑ ගැසීම




- ආඩම්බරකාර පෙනුමක් හා ගාම්භීර ඉරියව්වකින් ලැග සිටීම
- දඩයම් කිරීමේ දී රැක සිට ගොදුර මතට පැනීම හා පිම්ම වැරදුනහොත් පසුපස වේගයෙන් හඹා යයි. අල්ලා ගත් සතා මෙල්ල වන තුරුම උගේ ග්‍රහණය අත් නොහැරීම
- ආහාර ගැනීමේ දී ඉදිරි දෑත උපයෝගී කර ගනිමින් ගොදුරු පොළවට තද කර ගෙන තියුණු දත්වලින් ඉරා කෑම
- තම ගොදුර කටින් ඩැහැ ගනිමින් රැගෙන යෑම පාද දිගින් වැඩි නිසා උගේ ගමන පනිමින් යන ස්වරූපයකින් යුක්ත වීම




- ගමනේ වේගය වැඩි වන විට කුර ගැටීමෙන් නැගෙන හඬ තාලානුකූල ලක්ෂණයෙන් යුක්ත වීම
- නතර වී සිටින විට පාද ඔසවා තබමින් හිස පහතටත්, උඩටත්, දෙපසටත් සලමින් නොසන්සුන්කාරී ඉරියව්වක් පෙන්නුම් කිරීම




- ආඩම්බරකාර ගමන් රටාවකින් යුක්ත වීම
- ශරීරයේ පිටුපසින් ඇති පිල් හකුළා ගෙන දිගු දෙපා යුගල මාරුවෙන් මාරුවට තබමින් ගමනෙහි යෙදෙන විට ශරීරය ඉදිරියට පිටුපසට පැද්දෙන ආකාරයක් පෙන්වීම
- ගමනේ දී උගේ දිගු ගෙල සහිත හිස තාලානුකූල ව ලයාන්විත ආකාරයෙන් චලනය වීම
- ගමනේ දී මඳ දුරක් ගමන් කොට ගෙල හරවා වටපිට බලයි. දිගු ගෙල වරින් වර දෙපසින් පසුපසට යොමුකර ශරීරයේ පිහාටු අතරින් හොට යවා ශරීරය පිරිමැදීම
- කුඩා පඳුරුවල ගෙඩි සෙමෙන් හොටෙන් කඩා ගිල දැමීම හා ආහාර ගන්නා විට හිස එසවීම හා පහත් කිරීම
- පිල් විදහාලමින් කරනු ලබන රංගනයේ දී පිල් සහළ අවානක ආකාරයෙන් විසුරුවා වේගයෙන් සොලවමින් චක්‍රාකාර ලෙස කැරකීම




- හැඩලීමේ දී බෙල්ල හා හිස ඉහළ පහළ ගෙන යාම
- කෑම සොයා යෑමේ දී පයින් පහුරු ගෑම හා හොටින් ඇවිස්සීම
- ආහාරයක් ලැබුණු විට කෙටි ශබ්දයක් කරමින් කිකිළියන්ට අඬ ගැසීම පොරයට වැටුණු කල උඩ පනිමින් පාදයෙහි ඇති පොරකටුවෙන් ද හොටින් ද පහර දීම




- තටු නොසලා ගුවන් යානයක් මෙන් පාවෙමින් වෘත්තාකාර පථයක් තුළ පියාඹා යෑම
- තියුණු නෙත්වලින් පොළොව මත සිටින කුඩා සතුන් ඇත් ද යන්න විමසිලිමත්ව බැලීම
- ගමන් මඟ අතරතුර දිසාව වෙනස් කර ගැනීමට කිහිප විටක් තටු සැලීම
- ගොදුරක් දුටු සැණින් ඊයක් මෙන් ගොදුර වෙත පහත් වී පාද දෙකේ ඇති නියපොතුවලින් ඩැහැගැනීම

නර්තන චලන නිර්මාණයේ දී අවධානයට යොමු කළ යුතු කරුණු තුනකි.




නර්තනය මාධ්‍ය කොටගෙන සත්ත්ව චරිත ඇසුරින් නිර්මාණය කළ යුතු නර්තන නිර්මාණයක අවධානය යොමු කළ යුතු කරුණු

- නර්තන නිර්මාණය සඳහා තෝරා ගත් සත්ත්ව චරිතයෙහි වඩාත් කැපී පෙනෙන චර්යා ලක්ෂණ හඳුනා ගැනීම
- එකී චලනය තාලානුකූල හෝ රිද්මයානුකූල ලක්ෂණවලින් කවර අංගයකට ඇතුළත් වේ දැයි බැලීම
- තෝරා ගත් චලන නර්තනයකට පරිවර්තනය කිරීමේ දී කවර ආකාරයක චලන තෝරා ගත යුතුද යන්න සැලකිලිමත් වීම
- යොදා ගනු ලබන චලනයන්ගේ ලය වේගය හා තාණ්ඩව හෝ ලාස්‍ය බව හා ඖචිත්‍ය බවෙන් යුක්තව ගැළපීම
- අවකාශය නිසි පරිදි යොදා ගැනීම හා විවිධ තල මත ඉඳ චලන නිර්මාණය කිරීම
- නර්තන නිර්මාණය තුළින් අදාළ ප්‍රස්තුතය ඉස්මතු වීම

<u>කාර්ය පත්‍රිකාව</u>

➢ පහත වගු සම්පූර්ණ කරන්න. සතුන්ගේ සුවිශේෂී චලන ලියා දක්වන්න.



| නර්තනය | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය | 1 වාරය | |
| ගුරුභවතාගේ නම | : ඊ. පී. සවනි දිනේශිකා | අම්/ උක්සිරිපුර විදුහල |

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.2 පාද නිවැරදිව හැසිරවීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි.

## නර්තනය සඳහා පාද හුරුකර ගනිමු.



නර්තනය ඉගෙනුමට පිවිසෙන ආධුනික ශිල්පියෙකුට අවශ්‍ය කරන කායික හා මානසික පෙර සූදානමක් ඇති කිරීම අරමුණු කොට ගත් මූලික අභ්‍යාස මාලාව පා සරඹ නම් වේ. මෙම පා සරඹ උඩරට පහතරට සබරගමු යන දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහිම අන්තර්ගතය.

සරඹ අභ්‍යාස මඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත මූලික අරමුණ ලෙස පෙනී යන්නේ පාද හුරුකර ගැනීමයි. ඒ නිසාම පාද චලන සඳහා සුවිශේෂ අවධානයක් යොමුකර ඇති බව පෙනීයන හෙයින් මෙකී සරඹ සම්ප්‍රදායන් තුනෙහි දී ම පොදුවේ පා සරඹ යනුවෙන් හඳුන්වනු ලැබුවත් එක් එක් සම්ප්‍රදායට ආවේනික වූ පාරිභාෂිත නාමයන් භාවිතයේ ඇත. ඒ අනුව උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායේදී **පා සරඹ** නමින් ද සබරගමු නර්තන සම්ප්‍රදායේ දී **මණ්ඩිපද** නමින් ද මෙකී සරඹ මාලාව හඳුන්වනු ලැබේ. සම්ප්‍රදායන් තුනෙහිම මෙම සරඹ අභ්‍යාස සඳහා දණ්ඩිකඳ යොදා ගන්නා නිසා **දණ්ඩි සරඹ / දණ්ඩියමේ සරඹ** යන නමින් ද මෙම සරඹ හඳුන්වයි. සම්ප්‍රදායන් තුනෙහි ම පා සරඹ දොළස බැගින් ඇත. සෑම සරඹයක් අවසානයේ ම හමාර පදය නැටීම පිළිවෙතයි.

එමෙන්ම පා සරඹ සමගුණ, දෙගුණ (විලම්භ, මධ්‍ය.) වශයෙන් සරඹ අභ්‍යාස කිරීමත් සරඹය හමාර කිරීමේ දී මධ්‍ය ලයට පැමිණ හමාර පදය නැටීමත් සම්ප්‍රදායන් තුනටම අයත් පොදු ලක්ෂණයකි. පා සරඹ අභ්‍යාස කිරීමේ දී ප්‍රධාන අවධානය පාද අභ්‍යාස කෙරෙහි යොමු වුවද එකී අභ්‍යාසයන් මඟින් අතුරු අරමුණු රාශියක් ද සපුරා ගැනීමේ හැකියාව ඇත.

## පා සරඹ නැටීමේ වැදගත්කම

01. පාද හුරුකර ගැනීම.
02. මණ්ඩිය සකස් කර ගැනීම.
03. දණහිස් දෙපසට විහිද වීම සඳහා පුහුණුව.
04. පාද අතර තබා ගත යුතු දුර පිළිබඳ අවබෝධය
05. ශාරීරික නම්‍යතාව ඇතිකර ගැනීම.
06. කඳ ඍජුව තබා ගැනීම.
07. දැරීමේ හැකියාව.
08. විවිධ දිශා සහ තල අනුව චලන පුහුණුව
09. ශාරීරික නිරෝගීතාවය ඇති කිරීම.
10. තාල අවබෝධය ලැබීම.
11. ඉන්ද්‍රිය සමායෝජනය.
12. පාද චලන සහ ශාරීරික සබඳතා ගොඩනැගීම.
13. චලනයන්ගේ සමබරතාවය පවත්වා ගැනීම.
14. සමමිතික බව පවත්වා ගැනීම.

## පා සරඹ නර්තනයේදී දැකිය හැකි විශේෂ ලක්ෂණ

- පාද චලන පමණක් යොදා ගැනීම.
- පද කටින් කියා නර්තනය කිරීම.
- දණ්ඩි කඳ භාවිතය.
- බෙර යොදා නොගැනීම.
- තෙයි යන පදය මූලික කොට පැවතීම.
- සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ක්‍රමයෙන් වර්ධනය වීම.

## 6 , 7 ශ්‍රේණිවල පා සරඹ මතකයට නංවමු.

| | සරඹ නාමය | සරඹ පදය | හමාර පදය |
|---|---|---|---|
| 6ශ්‍රේණිය | අඩිය | තෙයි | තෙයියත් තෙයියත් තෙයියත් තාම් තෙයි තාම් තෙයි තෙයි තත් තත් තා |
| | දෑඩිය | තෙයි කිට තෙයි තාම් | |
| | තුන් අඩිය | තෙයි කිට/// තෙයි තාම් | |
| 7 ශ්‍රේණිය | සිව් අඩිය | තෙයිත// තෙයි තෙයියත් තාම් | |
| | දෑල අඩිය | තෙයි ති තා තෙයි | |
| | පසුපෙර අඩිය | තා තෙයියත් /// තා තෙයි | |

## 8 ශ්‍රේණියට නියමිත පා සරඹ

- ❖ පහත සඳහන් පා සරඹ පද තාල තබා හඬ නඟා කියමු. (තාලම්පට භාවිත කරන්න)
- ❖ සමගුණ හා දෙගුණ යන ලය පිලිබඳ අවබෝධයෙන් සරඹ අභ්‍යාස කරමු.

හත්වන පා සරඹය

- සරඹ නාමය - නුහුරු අඩිය
- සරඹ පදය - තා තෙයි තා තෙයියත් තාම්
- තාලය - මහ තනි තිත

| | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | තා | - | - | තෙ | යි | - | තා | - | තෙයි | - | යත් | - | තා | - | - | - |
| දෙගුණ | තා | තෙ | යි | තා | තෙයි | යත් | තා | ම් | තා | තෙ | යි | තා | තෙයි | යත් | තා | ම් |

අටවන පා සරඹය

- සරඹ නාමය - චක්‍ර අඩිය
- සරඹ පදය - තෙයියත් තෙයියත් තෙයියත් තාම් තෙයි තත්තක තෙයියත් තාම්
- තාලය - මහ තනි තිත

| | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | තෙයි | - | යත් | - | තෙයි | - | යත් | - | තෙයි | - | යත් | - | තා | ම් | - | - |
| | තෙයි | - | - | - | තත් | - | තක | - | තෙයි | - | යත් | - | තා | ම් | - | - |
| දෙගුණ | තෙයි | යත් | තෙයි | යත් | තෙයි | යත් | තා | ම් | තෙයි | - | තත් | තක | තෙයි | යත් | තා | ම් |

නවවන පා සරඹය

- සරඹ නාමය - දෙපැති අඩිය
- සරඹ පදය - තෙයි තත්තක තෙයි තෙයි තත්තක තෙයි තත්තක තෙයියත් තාම්
- තාලය - මහ තනි තිත

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | තෙයි - - -<br>තෙයි - - - | තත් - ත ක<br>තත් - ත ක | තෙයි - තෙයි -<br>තෙයි - යත් - | තත් - ත ක<br>තා ම් - - |
| දෙගුණ | තෙයි - තත් තක | තෙයි තෙයි තත් තක | තෙයි - තත් තක | තෙයි යත් තා ම් |

හමාර පදය - තෙයියත් තෙයියත් තෙයියත් තාම්
තෙයි තාම් තෙයි තෙයි තත් තත් තාම්
තාලය - මාත්‍රා 4 ට ( මහ තනිතිත )

| / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|
| තෙයි - යත් -<br>තෙයි - - -<br>තාම් | තෙයි - යත් -<br>තාම් - - - | තෙයි - යත් -<br>තෙයි - තෙයි - | තාම් - - -<br>තත් - තත් - |

## කාර්ය පත්‍රිකාව

➢ පහත සඳහන් ප්‍රශ්න සඳහා හරි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( X ) ලකුණද යොදන්න.

01. උඩරට නර්තන සම්ප්‍රදායේ සරඹ වර්ග දෙකකි. ( )
02. සරඹ අභ්‍යාසයේ දී සමගුණ වශයෙන් හඳුන්වනුයේ මධ්‍ය ලයට ය. ( )
03. මණ්ඩියට සිටීමේ දී දෙපා අතර පරතරය වියතකි. ( )
04. පා සරඹ දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහිම දැකිය නොහැක. ( )
05. සරඹ අභ්‍යාස මඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත මූලික අරමුණ පාද හුරුකර ගැනීමයි. ( )
06. සාම්ප්‍රදායන් තුනෙහි දී ම පොදුවේ පා සරඹ මණ්ඩි පද යනුවෙන් හඳුන්වනු ලබයි. ( )
07. සරඹ අභ්‍යාස සඳහා දණ්ඩිකඳ යොදා ගන්නා නිසා මෙම සරඹ මණ්ඩිපද ලෙස හඳුන්වයි. ( )
08. සම්ප්‍රදායන් තුනෙහිම පා සරඹ විස්ස බැගින් ඇත. ( )
09. සෑම සරඹයක් අවසානයේම හමාර පදය නැටීම පිළිවෙතයි. ( )
10. සරඹය හමාර කිරීමේ දී මධ්‍ය ලයට පැමිණ හමාර පදය නටයි. ( )

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

01. තෙයියත් තෙයියත් තෙයියත් තාම්//// යනුවෙන් උඩරට නර්තන සම්ප්‍රදායේදී කරනු ලබන්නේ
 1) පා සරඹ 2) නමස්කාර පදය 3) දොඹින පද 4) හමාරපදය

02. තෙයි යන පද මූලික කොට ගෙන ඇත්තේ
 1) බෙර වාදනයේදී 2) පා සරඹ නැටීමේදී 3) ගායනයේදී 4)ගොඩ සරඹවලදී

03. පා සරඹ නර්තනයේදී වාදනය කරන්නේ

1) ගැට බෙරය　　2) දණ්ඩි කඳ　　3) තාලම් පට　　4) දවුල

04. නර්තනයට අධිපති දෙවියන් වන්නේ

1) සරස්වතී දෙවි　　2) ශිව දෙවි　　3) ගණ දෙවි　　4) කතරගම දෙවි

05. සෑම පා සරඹයක් අවසානයේම නටනු ලබන්නේ

1) අඩිය　　2) හමාරපදය　　3) කස්තිරම　　4 ) ඉරට්ටිය

➢ යා කරන්න

| | |
|---|---|
| දෙපැති අඩිය | තෙයි කිට තෙයි තාම් |
| පසුපෙර අඩිය | තෙයි කිට/// තෙයි තාම් |
| අඩිය | තෙයියත් තෙයියත් තෙයියත් තාම් තෙයි තත්තක තෙයියත් තාම් |
| දෑල අඩිය | තෙයි තත්තක තෙයි තෙයි තත්තක තෙයි තත්තක තෙයියත් තාම් |
| නුහුරු අඩිය | තෙයිත// තෙයි තෙයියත් තාම් |
| තුන්අඩිය | තෙයි ති තා තෙයි |
| සිව් අඩිය | තා තෙයියත් /// තා තෙයි |
| දෑඩිය | තෙයි |
| කරනම් අඩිය | තා තෙයි තා තෙයියත් තාම් |

➢ ලබා දී ඇති තොරතුරු අනුව පහත වගුව සම්පූර්ණ කරන්න

| සාම්ප්‍රදාය | උඩරට | පහතරට | සබරගමු |
|---|---|---|---|
| සරඹ නාමය | | පා සරඹ | |
| සරඹ අවසන් කරන පදය | | | හමාරපදය සරඹ 12 සඳහාම එක්හමාරයකි. |
| සරඹ ගණන | | 12 | |
| සරඹ නාමයක් ඇත/නැත | නාමයක් ඇත | | |

➢ නියමිත අංගහාර අනුගමනය කරමින් 1 සිට 6 දක්වා පා සරඹ නර්තනය කරන්න



නිපුණතාව          :   2.0 නර්තන හා සබැඳි මුලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම  :   2.3  නර්තනය හා සබැඳි විධි ක්‍රම අනුගමනය කරමින් සරඹ ඉදිරිපත් කරයි.

## සාම්ප්‍රදායික නර්තනයට හස්ත පාද හුරුකර ගනිම



පා සරඹ නැටීමෙන් අනතුරුව ආධුනික ශිල්පියා ප්‍රගුණ කරන සරඹ ගොඩ සරඹ නම් වේ. ගොඩ සරඹ නැටීමේ අරමුණ වනුයේ දෑතේ හුරුව ලබාදීමයි. අත් ගෙන නටන නිසා අත් සරඹ යයිද කියයි. මෙහි සරඹ ගණන දොළසකි.

මෙම සරඹ නිවැරදිව පුරුදු පුහුණු වු ශිල්පියෙකුට සාම්ප්‍රදායික නර්තනයට අදාල අනෙකුත් නර්තනය ඉගෙනුමට අවස්ථාව හිමි වේ. නිශ්චිත අංගහාර හා හැඩතල පවත්වා ගැනීම නිසි ලෙස පුරුදු පුහුණු වන්නේ මෙකී සරඹ අභ්‍යාස තුලිනි. මෙම සරඹ ගොඩ නගා ඇත්තේ සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ක්‍රමයෙන් සංවර්ධනය වන ආකාරයෙනි.

පා සරඹ සඳහා මෙන් නොව ගොඩ සරඹ සඳහා එකී සාම්ප්‍රදායට අනන්‍ය වූ බෙරය භාවිත කරයි. ආධුනිකයා පළමුවෙන්ම බෙර වාදනය සඳහා නර්තනය අරඹන්නේ ගොඩ සරඹ නර්තනය තුලිනි. **විලම්බ, මධ්‍ය,** ලය ප්‍රභේද අනුව නර්තනයේ යෙදෙනවා මෙන්ම බෙර වාදකයා මුලික බෙර පද වලට වයනු ලබන අලංකාර බර පද හඳුනාගැනීමට ද ආධුනිකයාට ප්‍රථමයෙන් අවස්ථාව ලැබෙන්නේ මෙහිදී ය.

උඩරට සාම්ප්‍රදායේ සෑම ගොඩ සරඹයක් අවසානයේ ම එකී සරඹය සඳහා නිශ්චිත වු කස්තිරමක් නටනු ලැබේ. කස්තිරමක් යනු පද කොටසක් අවසානයේදී නටන විශේෂ පද කොටසකි . ගොඩ සරඹ දොළස හැඳින්වීම සඳහා වෙනම නම් දොලසක් ඇත.

පහතරට සාම්ප්‍රදායේදී මෙම සරඹ **ඉලංගම් සරඹ** නමින් හඳුන්වයි. සංඛ්‍යාව දොළසකි. කස්තිරම **ඉරට්ටිය** නමින් හඳුන්වයි. එක් එක් සරඹ සඳහා ඉරට්ටි දොළසකි. සරඹ හැඳින්වීමට විශේෂ නාමයක් නැත. සංඛ්‍යාත්මක නාමයෙන් හඳුන්වයි ( පළමු පදය , දෙවන පදය )

සබරගමු සාම්ප්‍රදායේදී **දොඹින පද** ලෙස හඳුන්වයි. කස්තිරම **හමාර පදය** ලෙස හඳුන්වයි. සරඹ දොළසකි. සරඹ දොළස සඳහාම එක් හමාර පදයකි. සරඹ හැඳින්වීමට විශේෂ නාමයක් නැත. සංඛ්‍යාත්මක නාමයෙන් හඳුන්වයි ( පළමු පදය ,දෙවන පදය )

## 6 , 7 ශ්‍රේණිවල ගොඩ සරඹ මතකයට නංවමු.

| | සරඹ නාමය | සරඹ පදය | කස්තිරම |
|---|---|---|---|
| 6 ශ්‍රේණිය | අඩිය | දොම් කිට කිට දොම් | තත් ජිත් තොං නං තා |
| | දෑඩිය | දොම් කිට කිට දොම් | තත් ජිත් තක ජිත් තත් ජිත් තොං නං තා |
| 7 ශ්‍රේණිය | තුන් අඩිය | දොම් කිට /// කිට දොම් | ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොම්කිට තා |
| | සිව් අඩිය | දොම් කිට /// කිට දොම් | ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් ගජිං ජිංත කුඳ ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොම්කිට තා |

## 8 ශ්‍රේණියට නියමිත ගොඩ සරඹ

- පහත සඳහන් ගොඩ සරඹ පද ලය දෙකට තාල තබා හඬ නඟා කියමු. (තාලම්පට භාවිත කරන්න)
- සරඹ පදයට අදාල කස්තිරම තාල තබා කියමු
- සමගුණ හා දෙගුණ යන ලය පිලිබඳ අවබෝධයෙන් සරඹ අභ්‍යාස කරමු.

**5 සරඹය** - ඇල සරඹය

පදය - දොම් කිට කිට දොම්

කස්තිරම - රුංතක ජිංතක තරිකිට කුන්දත්

තාග්ග ජිංතක තරිකිට කුන්දත්

රුංකත ජිංතක තරිකිට කුංදත් තා

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | දො මි කි ට | කි ට දො මි | දො මි කි ට | කි ට දො මි |
| දෙගුණ | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් |
| කස්තිරම | රුං තක ජිං තක<br>රුං තක ජිං තක | තරි කිට කුං දත්<br>තරි කිට කුං දත් | තාග් ග ජිං තක<br>තා - - - | තරි කිට කුං දත්<br>- - - - |

6 සරඹය - දැල සරඹය

පදය - දොම් කිට කිට දොම්

කස්තිරම - රුංතක ජිංතක තරිකිට කුන්දත් ///

තාග්ග ජිංතක තරිකිට කුන්දත් //

රුංකත ජිංතක තරිකිට කුංදත් තා

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | දො මි කි ට | කි ට දො මි | දො මි කි ට | කි ට දො මි |
| දෙගුණ | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් |
| කස්තිරම | රුං තක ජිං තක<br>රුං තක ජිං තක<br>තාග් ග ජිං තක<br>තා | තරි කිට කුං දත්<br>තරි කිට කුං දත්<br>තරි කිට කුං දත් | රුං තක ජිං තක<br>තාග් ග ජිං තක<br>රුං තක ජිං තක | තරි කිට කුං දත්<br>තරි කිට කුං දත්<br>තරි කිට කුං දත් |

## <u>කාර්ය පත්‍රිකාව</u>

➢ සරඹ නාමය පිළිවෙළට සැකසීම සඳහා අදාල අංකය ඉදිරියෙන් ඇති කොටුවෙහි යොදන්න

- දැඩිය ☐
- සිව් අඩිය ☐
- ඇල සරඹය ☐
- අඩිය ☐
- තුන් අඩිය ☐
- දැල සරඹය ☐

➢ වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.
( දැතේ හුරුව , දවුල , පා සරඹ , හමාරපදය , අත් සරඹ , ගොඩ සරඹ, කස්තිරම , පාද හුරුව , අඩව්ව , බෙරය )

01. පා සරඹ නැටීමෙන් අනතුරුව ආධුනික ශිල්පියා................ප්‍රගුණ කරයි.

02. ගොඩ සරඹ නැටීමේ අරමුණ වනුයේ..................... ........... ලබාදීමයි.

03. අත් ගෙන නටන නිසා................................................. ලෙස හඳුන්වයි.

04. පද කොටසක් අවසානයේ දී නටන විශේෂ පද කොටස.................... වේ.

05. ගොඩ සරඹ නර්තනය සඳහා .......................................... භාවිත කරයි.

➢ පහත ප්‍රශ්න සඳහා අදාල පිළිතුරු ඉදිරියෙන් ලියන්න.

01. නර්තනයේ මූලික අංගහාරය....................... ( දණ්ඩිය / මණ්ඩිය )
02. ගොඩ සරඹ ගණන ...................... ( 12 / 18 )
03. නර්තනයට පෙර පළමුවම සිදු කරයි..................... ( පා සරඹ / නමස්කාරය )
04. උඩරට නැටුමේ සරඹ ගණන. ........................ ( 12 / 02 )
05. තාල තැබීමට උචිත භාණ්ඩය................. ( ගැටබරය / තාලම්පට )
06. සමගුණ ලෙස හඳුන්වන්න්....................... ( මධ්‍ය / විලම්භ )
07. සරඹ 12 සඳහාම එක් හමාරපදයකි.............. ( සබරගමු සාම්ප්‍රදාය / පහතරට සාම්ප්‍රදාය)
08. මධ්‍ය ලය ලෙස හඳුන්වන්නේ...................... ( දෘතලය / දෙගුණය )
09. සිව් අඩියේ කස්තිරමට සමාන කස්තිරමක් ඇත්තේ ............ ( 2 සරඹයේ / 3සරඹයේ )
10. තත් ජිත් තක ජිත් මෙසේ ආරම්භ වන්නේ .................... ( 1 සරඹයේ / 2 සරඹයේ )

➢ පහත සඳහන් කස්තිරම සම්පූර්ණ කරන්න

01. රුංතක ජිංතක ..........................කුන්දත්
තාග්ග ..........................තරිකිට කුන්දත්
.......................ජිංතක තරිකිට කුංදත් තා

➢ පහත සඳහන් පද සම්බන්ධතාවය දැක්වෙන පරිදි යා කරන්න.

| | | |
|---|---|---|
| උඩරට | ඉලංගම් සරඹ | හමාරපදය |
| පහතරට | දොඹින පද | කස්තිරම |
| සබරගමු | ගොඩ සරඹ | ඉරට්ටිය |

➢ දොම් කිට කිට දොම් යන පදය සමගුණ හා දෙගුණයට ප්‍රස්තාර කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| සමගුණ | | | | |
| දෙගුණ | | | | |

➢ නියමිත අංගහාර අනුව ගොඩ සරඹ නර්තනය කරන්න.



| නර්තනය | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය | 1 වාරය | |
| ගුරුභවතාගේ නම | : ඊ. පී. සවනි දිනේශිකා | අම්/ උක්සිරිපුර විදුහල |

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.4 සාම්ප්‍රදායික නර්තන ඇසුරෙන් අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කරයි.

## බෙරහඬ මැද්දේ නටමු පද සිත් සේ



පරිසරය →



වර්ණ නාද චලන හැඩතල නිසා අලංකාර වේ.

## නර්තනයක සුන්දරත්වය දැකීමට අවශ්‍ය කුමක්දැයි සොයා බලමු.

- ශරීරයේ විවිධ කොටස් (අංග, උපාංග, ප්‍රත්‍යාංග) රිද්මයකටත් තාලයකටත් චලනය කිරීම නර්තනයවේ.
- නර්තනය ශරීර සෞඛ්‍යය ඉතා යහපත් ලෙස පවත්වා ගැනීමටත් ශරීරයේ හැඩය පවත්වා ගැනීමටත් උපකාරී වෙයි.
- ඔබ මීට පෙර පා සරඹ,ගොඩ සරඹ, වන්නම්, ගැමි නැටුම් හා ගීත අනුව නර්තනයේ යෙදී ඇත.
- පා සරඹ ගොඩ සරඹ යනු සාම්ප්‍රදායික නර්තනයේ මූලික පදනමයි.
- **ඔබ උගත් පා සරඹ ගොඩ සරඹ සඳහා, කැරකීම්, වාඩිවීම්, උඩ පැනීම්, විවිධ දිශාවලට ගමන් කිරීම ආදිය එක්කර නර්තන නිර්මාණය කිරීමෙන් එම නර්තනයේ රසය වැඩි කරගත හැක .**
- රසය වැඩි කරගත් නර්තන වල ඇතුලත් නර්තන පද අලංකාර මාත්‍රා ලෙස හැඳින්විය හැක.
- මෙසේ ශාස්ත්‍රීය නර්තන අලංකාර කිරීමට යොදා ගනු ලබන එක් මාධ්‍යයක් ලෙස අලංකාර මාත්‍රා හැඳින්විය හැක.
- වෙනත් නර්තන නිර්මාණ සඳහා ද අලංකාර මාත්‍රා භාවිත කල හැකිය.



**ගැමි නර්තන සඳහා**



**ගීතයකට නර්තනය කිරීමේ දී**

# අලංකාර මාත්‍රා නිර්මාණය

❖ **අලංකාර මාත්‍රා නිර්මාණයේදී අවකාශය මනාව භාවිත කල යුතුයි.**

අවකාශය යනු තමා වටා ඇති ඉඩකඩ ප්‍රමාණයයි. අවකාශ භාවිතය යනු නර්තනයකදී අපට ලබා ගත හැකි ඉඩ ප්‍රමාණය හඳුනාගැනීම හා එයින් උපරිම ප්‍රයෝජන ගැනීම වේ. අවකාශය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.



**පුද්ගල අවකාශය**

නර්තනයකදී එක් පුද්ගලයකු විසින් අත්පත් කරගන්නා ඉඩ ප්‍රමාණය



**පොදු අවකාශය**

නර්තනයකදී සමූහයක් විසින් අත්පත් කර ගන්නා ඉඩ ප්‍රමාණයයි.

.

❖ නර්තන නිර්මාණයකදී වාඩිවීම්, උඩ පැනීම් භාවිත කරමින් අලංකාර පද නිර්මාණය.

නර්තනයකදී විවිධ තල භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක. අවකාශයේ ශරීරය රඳවා ගනු ලබන ස්ථාන තල නම් වේ. චලනයක් සිදු කරන්නේ කවර හෝ තලයක් මත හිඳය. තල තුනක් ලෙස දැක්විය හැකිය.



මැද තලය



ඉහළ තලය



පහළ තලය

❖ **නර්තන නිර්මාණයකදී ඉදිරිපසට හා පසුපසට කැරකීම් භාවිත කරමින් අලංකාරපද නිර්මාණය**

නර්තනයකදී පැනීම් කැරකීම් භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක. ඉදිරියට කැරකීම පසුපසට කැරකීම අර්ධව කැරකීම යොදා ගනී. ඉදිරියට පැත්තට ඉහලට පැනීම් යොදා ගනී.





❖ **නර්තන නිර්මාණයක දී විවිධ දිශා වලට ගමන් කරමින් අලංකාර පද නිර්මාණය.**

නර්තනයකදී විවිධ දිශා භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක . චලනයක් තුලින් මතු වන්නේ කිසියම් ජ්‍යාමිතික හැඩයකි. චලන කිහිපයක් එක් වීම ජ්‍යාමිතික හැඩතල සමූහයකගේ සංයෝගයයි. මෙම හැඩතල ඒකාකාර රටාවක් ලෙස නොපවතී. මොහොතින් මොහොත වෙනස් වේ. සුන්දරත්වයක් ඇති වන්නේ මෙසේ වෙනස් වන හැඩයන් තුලිනි.







6 , 7 ශ්‍රේණියේදී ඔබ 12 / 12 හා 12 / 123 තිතට අලංකාර පද නිර්මාණය කරන ලදී.

- ➢ එම අලංකාරපද මතකයට නංවා ගනිමින් .
- ➢ ඉහත උපදෙස් අනුව විවිධත්වයක් මතුවන පරිදි 8 ශ්‍රේණියට අදාල මාත්‍රා 3 + 3 තිතට අලංකාර පද නිර්මාණය කරමු.

තාලය - 123 / 123 ( මැදුම් තනිතිත)

බෙර පදය - ජිං ගත ගත ගො ගො

- නිර්මාණය කරගත් අලංකාර පද නිරන්තර අභ්‍යාසයේ යෙදීමෙන් ප්‍රායෝගික කුසලතාව වර්ධනය වේ.

## අලංකාර පද නිර්මාණයේදි සැලකිලිමත් විය යුතු කරුණු

- සාම්ප්‍රදායික නර්තනයට හානි නොවන අයුරින් අලංකාර පද නිර්මාණය කල යුතයි.
- සම්ප්‍රදායට ආවේනික චලන භාවිත කල යුතුයි.
- නිවැරදි අංගහාර පවත්වා ගනිමින් නර්තනය කල යුතුයි.
- අවකාශය මනාව භාවිත වන පරිදි අලංකාර මාත්‍රා නිර්මාණය කල යුතුයි.

## කාර්ය පත්‍රිකාව

➢ පහත සඳහන් ප්‍රශ්න සඳහා හරි නම්( ✓ ) ලකුණද වැරදි නම් (x) ලකුණද යොදන්න

01.සාම්ප්‍රදායික නර්තනයට හානි වන අයුරින් අලංකාර පද නිර්මාණය කල යුතුයි. ( )

02. අලංකාර පද නිරන්තර අභ්‍යාසයේ යෙදීමෙන් ප්‍රායෝගික කුසලතාව වර්ධනය නොවේ. ( )

03.12 / 123 තාල රූපයට අයත් බෙර පදයකි ජිං ගත ගො ගො. ( )

04.නර්තන නිර්මාණයකදී විවිධ දිශාවලට ගමන් කරමින් අලංකාර පද නිර්මාණය කල හැක. ( )

05.නර්තනය ශරීර සෞඛ්‍යය ඉතා යහපත් ලෙස පවත්වා ගැනීමට උපකාරී නොවේ. ( )

➢ පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

01 නර්තනය යන්න කෙටියෙන් හඳුන්වන්න

02 නර්තනයේදී භාවිත අවකාශයේ ප්‍රධාන කොටස් දෙක ලියන්න

03 නර්තනයකදී භාවිතයට ගන්නා තල තුන නම් කරන්න

04 අලංකාර පද නිර්මාණය සඳහා භාවිත කළ විධික්‍රම 2ක් ලියන්න

05 නිර්මාණය කර ගත් අලංකාර පද නිරන්තරයෙන් අභ්‍යාස කිරීමෙන් ලැබෙන වාසි 2ක් ලියන්න

➢ හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න
(අවකාශය/ පරිසරය / අංගහාර / මුලික/ වාඩිවීම්, උඩ පැනීම් )

01.පා සරඹ ගොඩ සරඹ යනු සාම්ප්‍රදායික නර්තනයේ............................ පදනමයි

02.නර්තන නිර්මාණයකදී ..................................භාවිත කරමින් අලංකාර පද නිර්මාණය කරයි.

03.අලංකාර මාත්‍රා නිර්මාණයේදී ............................... මනාව භාවිත කරයි.

04.වර්ණ, නාද ,චලන ,හැඩතල නිසා............................ අලංකාර වේ.

05. නිවැරදි............................ පවත්වා ගනිමින් නර්තනය කල යුතුයි.

නර්තනය

8 ශ්‍රේණිය.  1 - වාරය

ගුරුභවතාගේ නම : Y.G.U.S. රාජපක්ෂ  අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය

නිපුණතාව : 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනා කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 4.1 නිර්දේශිත ගායනාවල සාමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.

**සවරං / පතුරු / සිරස පාද කවි හා බැඳි සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු.**

6,7 ශ්‍රේණි වල දී උගත් ජන ගායනා පිළිබඳ දැනුම භාවිතා කරමින් සවරං, පතුරු , සිරස පාද කවි පිළිබඳ අධ්‍යනය කරමු.

**සවරං කවි හා බැඳි සමාජ සංස්කෘතික පසුබිම**



දේශිය ගැමි නැටුම් අතර ඉතා අලංකාර නර්තනයකි. මෙම නැටුමේදි ගායනා කරන කවි සවරං කවි ලෙස හැඳින්වේ. සවරං නර්තනයේ විවිධ අවස්ථා නිරූපණය වන පරිදි ගායනා නිර්මාණය වී ඇත. ගැමි ඇදහිලි හා විශ්වාස , සමාජ සාරධර්ම ආදි සංකල්ප මෙම ගායනා තුල අන්තර්ගත වේ. මෙම කවි ගායනා සඳහා ඉතා සරල සුමට බස් වහරක් යොදා ගෙන ඇත.

" දෙවියන් වැඳලා මෙරගට බැහැලා පටන් ගනිමු සවරන් "

" සූරිය දෙව් රජුනි අවසර දෙවන් මට "

" බඹර පෙතක් සේ කැරකෙන සවරම "

සවරං කවි විවිධ තාල රූප වලට අනුව ගායනා කල හැකිය. එසේම ප්‍රාදේශිය වෙනස්කම් වලට අනුව නාද මාලාවේ විවිධ අඩු වැඩි වීම් දක්නට ලැබේ.

**සවරං කවි**  තාල රූපය මාත්‍රා 3 + 3

| | | | |
|---|---|---|---|
| පැවිය ගල් රුහැන් ජය රුස් | වඩින්නට | දැතට ගන්නේ සවරං පවන් | සලන්නේ |
| වීරිය කර සිතින් ගනදුරු | හරින්නට | සරඹ පාන්නේ පාපොඩි දෙක | හසුරන්නේ |
| කාරිය තමයි සවරං ගෙන | රගන්නට | ගීත කියන්නේ සුමිහිරි තාල | වයන්නේ |
| සූරිය දෙව් රජුනි අවසර දෙවන් | මට | සබයට එන්නේ සවරං නැටුම් | නටන්නේ |

තාල රූපය මාත්‍රා 4 + 4

| | |
|---|---|
| මල් ගවසාලා කොණ්ඩය | බැදලා |
| ඉණ තද කර සළු පැළඳ | ගෙනේ |
| පියයුරු නිමලා එන ළැම | උඳුලා |
| සළු පොටකින් වසමින් | යසිනේ |

## පතුරු නර්තනය හා බැඳි සමාජ සංස්කෘතික පසුබිම



පතුරු නැටුම හා සම්බන්ධව ඊට ආවේණික වූ ගායනා අද්‍යතන ව්‍යවහාරයේ පවතී. පතුරු නැටුම සමඟ යෙදෙන චලන රටාවත් රංග රටාවන්ගේ විවිධතාවත් අනුව මෙකී ගායනා නිර්මාණය වී ඇත. මෙම පතුරු ගායනා සරලය. පතුරෙන් නැගෙන තාලානුකූල ශබ්ද රටාවට අනුකූල වන පරිදි පතුරු ගායනාවන්ගේ නාදමාලාව හා තාල රූප අන්තර්ගත කොට ඇත.

පතුරු කවි ගායනා මගින් ගැමි සමාජයේ සහයෝගීතාව , අව්‍යාජ බව , ඇදහිලි , විශ්වාස , ගුරු භක්තිය මනාව ඉස්මතු කර දක්වා ඇත.

" සූරිය කුල ඇති හිරු දෙවියන්නේ ........."

" අතුරු නැතිව සබයේ සිටිමින්නේ........."

මෙකී පතුරු කවි නියමිත නාද මාලාවන්ට අනුව ගායනා කිරීම තුල එහි සංස්කෘතික , සමාජීය වටිනාකම ආරක්ෂා කර ගත හැකිය.

## පතුරු කවි

තාල රූපය මාත්‍රා 4 + 4

| | | | |
|---|---|---|---|
| ලොව සෙත් කරවන පත්තිනි | සදිනේ | සූරිය කුල ඇති හිරු | දෙවියන්නේ |
| සළුවක් අරගෙන සළු | සලමින්නේ | පැවිය අණසක ලොව | පවතින්නේ |
| වෙනසක් නොසිතා මගේ | ගුරුවරුනේ | කාරිය කරවා පහදා | දෙන්නේ |
| පතුරක් අරගෙන රගදෙමු | තොසිනේ | පතුරු නැටීමට අවසර | දෙන්නේ |

## සිරස පාද කවි හා බැඳි සමාජ සංස්කෘතික පසුබිම

අතීතයේදී බොහෝ ලෙඩ රෝග සුව කිරීම සදහා ශාන්ති කර්ම පවත්වන ලදී. එකී ශාන්ති කර්මවලදී ගායනා කරනු ලබන කවි විශේෂයක් ලෙස මෙම " සිරස පාද කවි " හඳුන්වාදිය හැක. උඩරට , පහතරට , සබරගමු යන සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහිම මෙම ගායනා දක්නට ලැබේ. ආතුරයාගේ හිසේ සිට පාදාන්තය දක්වා සකල දෝෂයන් දුරු වේවා යනුවෙන් ප්‍රාර්ථනා කරමින් ගයනු ලැබේ.

" හිස මුව තුල බෙල්ල දෙවුර දෑතේ දසැගිලි අගිනේ........ "

ඒ ඒ සම්ප්‍රදායන්ට අනුව නාදමාලා වෙනස් වේ. එකම කවිය නාදමාලා කිහිපයකින් ගායනා කෙරේ. සිරස පාද කවි ගායනා සඳහා " බුදු ගුණ , බෝසත් ගුණ , සත්සතිය , පූජනීය ස්ථානවල බල මහිම , දස පාරමිතාව ආදිය යොදා ගෙන ඇත. සිරස පාද කවි පන්ති අනුව වෙන් කිරීමේදී බුදු ගුණ සිරස පාද කවි , සත් සති සිරස පාද කවි , සත් දින සිරස පාද කවි , අං පොළ සිරස පාද කවි , ඒකාක්ෂර සිරස පාද කවි යනුවෙන් වෙන් කල හැකිය. දේව සිරස පාද කවිද මේ අතරට ගැනේ. මෙකි සිරස පාද කවි විවිධ විරිත් ලක්ෂණ , විවිධ නිර්මාණ කාව්‍ය ආකෘති අනුව නිර්මාණය වී ඇත.

## සිරස පාද කවි

තාල රූපය මාත්‍රා 3 + 3

සොළසා සංඛය පළමුව පෙරුම් පිරූ          බලයෙන්දා
මෙලෙස මුනිඳු වජ්‍රාසන වැඩහිඳ කෙලෙසුන්          බින්දා
කලස රැගෙන මිහිකත දෙස් කී අනුහස්          බලයෙන්දා
සිරස නළල පැමිණි දෝස දුරලන් මුනි          බලයෙන්දා



හිස මුව තුළ බෙල්ල දෙවුර දැතේ දසැඟිලි          අගිනේ
ළමැද උදර නාබි කටිය දෙකුල දෙකලව          දෙදණේ
කෙණ්ඩ බොලට දෙපිටි පතුල දසැඟිලි දසනිය          අගිනේ
සුවිසි මුනිඳු අනුහසයෙන් හැම පිරිපත දුර          හරිනේ

## කාර්ය පත්‍රිකාව

➢ පහත වාක්‍ය කියවා හිස්තැන් පුරවන්න.

1) ............................................................ ඉතා ආකර්ෂණීය නර්තන අංගයකි.
2) ශාන්තිකර්ම ත්‍රිත්වයෙහිම ............................................... කවි දක්නට ලැබේ.
3) ශරිරයේ විවිධ ස්ථාන වලට තට්ටු කරමින් හඬ උපදවන උපකරණයකි. ................................
4) ......................................... , ........................................... යනුවෙන් සිරස පාද කවි කවි පන්ති දක්නට ලැබේ.
5) සවරං කවි ......................................... , ......................................... යන තාල රූපයන්ටද ගායනා කල හැක.
6) ආතුරයාගේ ......................................... සිට ...................................... දක්වා දෝෂ දුරු කිරීමට......................................... ගායනා කරයි.
7) පතුරු කවි ......................................... තාල රූපයට ගායනා කල හැකිය.
8) සිරස පාද කවින් හි ....................................... , ....................................... , ............................................... ආදිය අන්තර්ගත වේ.
9) ......................................... මුල් කරගෙන පතුරු නර්තන ගායනා නිර්මාණය වී ඇත.
10) “ මල් ගවසාලා කොණ්ඩය බැඳලා “ යන කවිය ......................................... ගායනාවකි.

➢ පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(1) සවරං ගායනා තුල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ 02ක් ලියන්න.
(2) පතුරු කවි ගායනා තුල දක්නට ලැබෙන සුවිශේෂි ලක්ෂණ 02ක් ලියන්න.
(3) සිරස පාද කවි ගායනාවන්හි අන්තර්ගතය කරුණු වශයෙන් දක්වන්න.
(4) මාත්‍රා 4/4 අයත් පතුරු කවියක් ලියන්න.
(5) ඔබ කැමති සිරස පාද / සවරං කවියක් ලියන්න.

නර්තනය

8 ශ්‍රේණිය. 1 - වාරය

ගුරුභවතාගේ නම : කේ.ජී. නදීකා නිමාලි රාජපක්ෂ අම්/පරගහකැලේ ම.වි

නිපුණතාව : 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනා කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 4.2 නියමිත තාල රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි.

## ගායනයේ යෙදෙමු

සෑම ගායනයකටම අදාළ නාද මාලාවක් , තාල රූපයක් මෙන්ම ගති ලක්ෂණයක් ද ඇත. එක් එක් සම්ප්‍රදායට අනුව ගායනාවල නාද මාලා වෙනස් වේ.

## වෛරොඩි වන්නම,

උඩරට , පහතරට , සබරගමු යන සම්ප්‍රදායන් තුනටම ගායනා සහිත නර්තන විශේෂයක් ලෙස වන්නම් හඳුන්වා දිය හැකිය. වන්නම යනු වැනුම නොහොත් වර්ණනාවකි. මුල් කාලයේදී ගායනය සඳහා රචනා වී පසුව එයට නර්තනය එක් කරන ලදි.

උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් 18 අතරින් මාත්‍රා 3 තාල රූපයට(මැදුම් තනි තිත.) වෛරොඩි වන්නම ගායනා කරයි. වෛරෝඩිය යනු “මැණික” වේ. නමුත් මෙම වන්නමේ කවි ගායනය තුළින් පවසන්නේ මැණිකක් පිළිබඳව නොව කෙහෙතුගේ විමානය පිළිබඳව **ඊශ්වර දෙවියන් හා කෙහෙතු අතර පැවති සංවාදය** මැණිකකට උපමා කිරීමයි.

වන්නමක තානම මගින් ගායනයේ නාද මාලාව හඳුනා ගත හැකි වන අතර කවිය මගින් වන්නමක ප්‍රස්තුතය විස්තර කරයි.

- ගායනය ආරම්භයේදී අවග්‍රහයෙන් ආරම්භ කිරීම මෙම වන්නමේ සුවිශේෂී ලක්ෂණයකි.
- වාද ලක්ෂණ වලින් යුක්තය.
- ව්‍යංගාර්ථයෙන් අදහස් ප්‍රකාශ කරන අතර උසස් පද රචනයකින් යුක්තය.

## වෛරොඩි වන්නම ගායනයේදී හඳුනාගත යුතු ලක්ෂණ

- වෛරොඩි වන්නමට අදාළ ගායනය සාම්ප්‍රදායිකය.
- නිශ්චිත තාල රූපයක් හා නාද මාලාවක් ඇත.
- මධ්‍ය ලයෙන් ගායනා කරයි.වන්නමට අදාළව බෙර පදයක් ඇත.
- ගායනය අවග්‍රහයෙන් ආරම්භ කරයි.
- ගායනය තුළ ඇදෙන ස්ථාන හා නතර වන ස්ථාන හොඳින් හඳුනාගත යුතුය.

**<u>වෛරොඩි වන්නම ගායනා කරමු.</u>**

- තිත : මාත්‍රා 3 තනි තිත (මැදුම් තනි තිත)
- තාල රූපය : 1 2 3 / 1 2 3
- බෙර පදය : ජිංගත ගොගො
- තානම : තනෙන තනෙන තනෙන තනා
  තානත්තෙයි තානාත්තෙයි තානත්තෙයි තනා
  තනෙන තනා තානාතෙඉ තනා
  තානත්තෙයි තන තම්දන තම්ද
  නා තම්ද නා නා
- 1 කවිය : අගය වඩින කවි වරුණා
  රඟය දැනෙයි කළ රචනා
  මට උරණා නොව මෙදිනා
  මහතුගෙ අවසර රැගෙන සමාවා
- 2 කවිය : ඉසුරු දෙවිඳු වඩින දිනා
  කෙහෙතු විමන දැක නෙතිනා
  එම විමනා දෙවි වඩිනා
  කෙහෙතුද දැක කොයි වඩිති කමාවා
- 3 කවිය : විමන සමග කෙහෙතු දැනා
  ඉසුරු දෙවිඳු තුති දෙමිනා
  එම වරුනා කළ යෙහෙනා
  පාතල වෛරොඩි වන්නම මේවා
- 4 කවිය : ඔබින මෙසබ තුළ පැමිණා
  කවිය නැති ව බොරු වරුණා
  කළ දුදනා නැත ඔබිනා
  උගතුගේ බල වැඩි මොකද පමාවා

- කස්තිරම : රුදගත ගත ගත කුකුදත්
  ගජිංත ගත් ජිත් කුංදත්
  කුකුද ගජිං කුකුද ගජිං
  තකුද තකට ගත කුද කුද
  ගජිංත ගත් ජික් කුදත්
  ජිකුතක තරිකිට කුංදත් තා

කාර්ය පත්‍රිකාව

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න
  1. වන්නම් යනු,
     1) වැනුම නැතහොත් වර්ණනා කිරීමකි  2) කවි පන්තියකි
     3) වර්ණ ගැන්වීමකි  4) සත්තු ගැන කියවෙන්නකි
  2. උඩරට , පහතරට , සබරගමු වන්නම් ගණන පිළිවෙලින්,
     1) 10 , 32 , 18 කි  2) 32 , 18 , 24 කි
     3) 18 , 32 , 24 කි  4) 20 , 18 , 30 කි
  3. වෛරොඩිය යනු,
     1) සතෙකි  2) සංවාදයකි
     3) මැනිකකි  4) තරගයකි
  4. උඩරට වන්නමක කොටස් ගණන,
     1) අටකි  2) හතරකි  3) හයකි  4) පහකි
  5. වෛරොඩි වන්නමේ තාල රූපය වන්නේ
     1) මාත්‍රා 2 තාල රූප  2) සුළු තනි තිත
     3) මත්‍රා 3 තාල රූපය  4) මහ තනි තිත
- හිස්තැන් පුරවන්න.
  1. මුල් කාලයේ දී වන්නම් ............................................... සඳහා නිර්මාණය විය.
  2. වන්නමක තානම මගින් එහි .......................................... හඳුනා ගත හැකිවේ.
  3. වෛරොඩි වන්නම .......................................... ලක්ෂණ වලින් යුක්තය.
  4. ජිංගත ගොගො ................................ වන්නමේ බෙර පදය වේ.
  5. වෛරොඩි වන්නම .................................. හා ඊශ්වර දෙවියන් අතර වූ සංවාදයක් මුල්කොට ගෙන නිර්මාණය වී ඇත.
- පිළිතුරු ලියන්න
  1. උඩරට වන්නමක කොටස් ගණන කීයද ? ඒ මොනවා ද?
  2. වෛරොඩි වන්නමට අදාළ තාල රූපය හා බෙර පදය නම් කරන්න.
  3. වෛරොඩි වන්නමේ තානම හා කවියක් ලියන්න.
  4. වන්නමට තාල තබමින් ගායනා කරන්න.
  5. වන්නමට අදාළ පද කොටස් නිවැරදි අංගහාර සහිතව නර්තනය කරන්න.

නිපුණතාව : 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලැබෙන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම : 1.3 ගැමි නැටුම් හා බැඳි සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණය කරයි.

## සවරං නැටුම හා බැඳි සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනිමු.

සවරං නර්තනය දේශීය ජන නැටුම් අතර දක්නට ලැබෙන අතිශයින්ම සුන්දර , මනස්කාන්ත නර්තනාංගයක් වශයෙන් හැඳින්විය හැකිය. දෙපසෙහි යෙදූ එල්ලා වැටෙන සවරම් රැලි සහිත ලී පොලු දෙකක් දෑතින් ගෙන කරනු ලබන මෙකී නර්තනයේදී සවරම් කැරකීමෙන් අවකාශයෙහි ගොඩ නැගෙන විචිත්‍රවත් දර්ශනය නිසාම අනෙකුත් ගැමි නැටුම්වලට වඩා අපූරු බවක් මෙකී නර්තනයේදී දක්නට ලැබේ.

“සවරං ගසනවා”,”සවරමේ යනවා”,”හරිම සවරමක්”,”සවරං නටන්න එපා" ආදි වශයෙන් යෙදෙන යෙදුම් කොතෙකුත් භාවිතයේදී අසන්නට දකින්නට ඇත. මෙම යෙදුම් භාවිතයට මූලාශ්‍ර වූයේ සවරම් නැටුම බවට සැකයක් නොමැත.

සවරම් අගල් 2ක් පමණ රවුම් අගල් 18 පමණ දිග ලී දණ්ඩක දෙපසින් එල්ලා වැටෙන සේ රැලි යොදා සකස් කර ගත් උපකරණයකි. සවරං ලී දෙපස සවරං රැලි යොදා තිබීම හේතුවෙන් ලීයේ මැදින් අල්ලා ගෙන චලන දැක්වීම මෙහි විශේෂ ලක්ෂණයකි. එසේම ලී කෙළිවල මෙන් පොලු එකට ගැටීමක් සිදු නොවේ. එසේම චාමර නර්තනයේදී මෙන් චලනවල ලයාන්විත කෝමල බවක් සහ විලම්බ චලන හැසිරීමක් සවරං නර්තනයේදී දක්නට නොමැත.



සවරං නර්තනය සඳහා අදාල චලන මධ්‍ය ලය සහ දෘත ලය වේගයන් අනුව යෙදෙන බව පෙනේ. සවරං නර්තනය සඳහා යොදා ගනු ලබන ගායනා විවිධ තාල රූප ඇසුරු කරන්නා සේම විවිධ නාද මාලාවන්ගෙන්ද යුක්තය. සවරං නර්තනය ද විනෝදාස්වාදය මුල් කරගෙන ප්‍රභවය වී ඇති නමුදු අනෙක් ගැමි නැටුම්වල මෙන් මිහිකත , ඉර - සඳ වැනි සොබා දහමෙන් අවසර පැතීම සිදුවේ.

## සවරං නර්තනයක් නිර්මාණයේදී සැලකිය යුතු කරුණු.

- ✳ සවරම හරි මැදින් දැතෙහි ඇඟිලි කරු අතර රඳවා ගැනීම.
- ✳ සවරං ලී එකිනෙක ගැටීමක් සිදු නොකිරීම.
- ✳ යුගල වශයෙන් නර්තනය කරන විට සවරම මාරු කිරීම , උඩ දැමීම ආදිය කල හැකිය.
- ✳ සවරං නර්තනයේදී සවරං එකට වැදීම වැලැක්වීම සඳහා අවකාශ භාවිතය හා රංග රටා නිර්මාණයේදී සැලකිලිමත් විය යුතුය.
- ✳ සවරම හැසිරවීමේදී සවරම ඉහලට හා පහළට යන චලන බඳ වටා යන පරිදි සවරම කැරකීම ආදිය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

## පතුරු නැටුම හා බැඳි සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනිමු.

පතුරු නර්තනය විනෝදාස්වාදය මුල්කොට ගෙන නිර්මාණය වී ඇත. මෙම නර්තනයේ ප්‍රභවය පිළිබඳව නිශ්චිත තොරතුරක් නොමැති වුවද වන්නි ප්‍රදේශවල සකලයන් ඇඹවීමට ( කුරුල්ලන් එලවීමට ) පතුරට සමාන උපකරණයක් භාවිතා කොට ඇත. ලී පතුරක් කපා සකස් කල එකී උපකරණය පතුරේ හැඩයට සමාන වන නිසා එය පතුරු නර්තනයේ ප්‍රභවයට හේතු වුවේ යැයි සැලකේ.



### ➢ පතුර සකස් කිරීම.

- ✳ කොස් , මහෝගනී , දවුල් කුරුඳු වැනි ශාක භාවිතා කෙරේ.
- ✳ අගල් 15-18 පමණ දිග , අගල් 2ක් පමණ පහලින්ද, අගල් ½ පමණ ඝණකමින් පතුර සකස් කෙරේ.
- ✳ ලී පතුරේ ඝණකම කොටසේ අගල් 8-9 පමණ දිගට කැපුමක් යොදයි. කැපුම් නොයෙදූ කොටස අල්ලා ගත හැකි මිටක් ලෙස සකස් වේ.

## පතුරු නර්තන නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු.

- ✳ පතුර නිවැරදි ලෙස අතෙහි රදවා ගැනීම.
- ✳ නර්තන නිර්මාණයේදී නළල, උරහිස, අත්ල, වැලමිට, කළවා, දණහිස, යටිපතුල, වැනි ශරීර ස්ථානවලට තට්ටු කරමින් හඬ උපදවා ගැනීම.
- ✳ රංග රටා හා රංග වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වීම.

## <u>කාර්ය පත්‍රිකාව</u>

➤ පහත දැක්වෙන රූප දෙස බලා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




A



B

01. A රූපයේ දක්වා ඇති නර්තන අංගය නම් කරන්න.
02. A රූපයේ නර්තනයේ යෙදීමේදී භාවිතා කර ඇති රංග උපකරණය නම් කරන්න.
03. A රූපයේ නර්තන අංගයේ සුවිශේෂී ලක්ෂණයක් ලියන්න.
04. B රූපයේ දක්වා ඇති නර්තන අංගය නම් කරන්න.
05. B රූපයේ දැක්වෙන නර්තනයේ රංග උපකරණය ලෙස භාවිතා කර ඇත්තේ කුමක්ද?
06. එම උපකරණ සෑදීමට යොදාගනු ලබන දැව වර්ගය නම් කරන්න.

➤ නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| (1) ශරීරයේ විවිධ ස්ථානවලට තට්ටු කරමින් ශබ්ද නිපදවයි. | අඟල් 18 පමණ |
| (2) ඉහළ අවකාශයේ රටා මවයි. | පතුරු නැටුම |
| (3) පතුර සකස් කිරීමට | සවරං නැටුම |
| (4) සවරමේ දිග ප්‍රමාණය | දවුල් කුරුඳු |

➤ අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. සවරං නැටුමේ පසුබිම කෙටියෙන් හඳුන්වන්න.
2. සවරං නර්තන නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු ලියා දක්වන්න.
3. පතුරු නැටුමේ පසුබිම කෙටියෙන් විස්තර කරන්න.
4. පතුරු නර්තන නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු ලියා දක්වන්න.
5. ඔබ කැමති සවරං හෝ පතුරු කවියක් ලියන්න.

නර්තනය

8 ශ්‍රේණිය. 11 - වාරය

ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.සුරංගා කසුන්මාලි අම්/පාදාගොඩ විද්‍යාලය

නිපුණතාව: 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 3.1 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

## පහතරට බෙරය



පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය පහතරට බෙරයයි. යක්බෙරය, රුහුණු බෙරය, දෙවොල් බෙරය, දික් බෙරය, ඝෝෂක බෙරය යන විවිධ නම්වලින් ද හැඳින්වේ.යක් තොවිල්වලට යොදා ගන්නා බැවින් යක් බෙරය ලෙසත්, දෙවොල් මඩුවට යොදා ගන්නා බැවින් දෙවොල් බෙරය ලෙසත්, රුහුණු ප්‍රදේශයේ භාවිත කරන බැවින් රුහුණු බෙරය ලෙසත්, මහා ඝෝෂාකාරී ශබ්දයක් ඇති බැවින් ඝෝෂක බෙරය ලෙසත්, දිගටි ස්වරූපයෙන් ඇති බැවින් දික් බෙරය ලෙසත් මෙය හඳුන්වනු ලැබේ.

පහතරට බෙරය සිලින්ඩරාකාර හැඩයෙන් යුක්ත වේ.මෙම බෙරය අතින් පමණක් වාදනය කරන බැවින් පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයේ ආතත ගණයෙහි ලා සැලකේ.



## පහතරට බෙරයේ කොටස්




## කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර තෝරන්න

(01) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන්නේ,

(1) යක්බෙරය (2) දවුල (3) තම්මැට්ටම (4) ගැටබෙරය

(02) පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයේ පහතරට බෙරය හඳුන්වනු ලබන්නේ,

(1) විතත (2) ආතත (3) විතතාතත (4) ඝන

(03) පහතරට බෙරය, රුහුණු ප්‍රදේශයේ භාවිත කරන බැවින් හඳුන්වනු ලබන්නේ,

(1) යක් බෙරය (2) දෙවොල් බෙරය (3) දික් බෙරය (4) රුහුණු බෙරය

(04) සිලින්ඩරාකාර හැඩයෙන් යුත් වාද්‍ය භාණ්ඩයකි,

(1) උඩැක්කිය (2) තම්මැට්ටම (3) පහතරට බෙරය (4) රබාන

(05) පහතරට බෙරයේ බෙර ඇසට යොදා ගනු ලබන්නේ,

(1) හරක් හම (2) හරක් බොක්කේ සිවිය (3) එලු හම (4) තලගොයි හම

➢ හිස්තැන් පුරවන්න.

(06) පහතරට බෙරයේ දකුණු ඇස හඳුන්වනු ලබන්නේ ................................ ලෙසයි.

(07) බෙරය දිගටි ස්වරූපයෙන් ඇති බැවින් ........................... ලෙස හඳුන්වනු ලැබේ.

(08) බෙර කඳෙහි දිග ප්‍රමාණය .................................... කි.

(09) බීජාක්ෂර වැයීමේ දී දිත්,නං අක්ෂර වාදනය කරන්නේ බෙරයේ ........................ නි.

(10) බෙරය සෑදීමේ දී යොදා ගනු ලබන ලී වර්ග ගනු ලබන්නේ ......................................ගස්වලිනි.

➢ නිවැරදි පිළිතුරු සපයන්න.

(01) බෙර කඳ සඳහා යොදා ගන්නා ලී වර්ග 05ක් නම් කරන්න.

(02) බෙර හැක්ම, වෙනිවර, වරපටි හා බෙර ඇස සඳහා යොදා ගන්නා සම් වර්ග නම් කරන්න.

(03) පහතරට බෙරය හඳුන්වනු ලබන වෙනත් නාමයන් නම් කර ඒවා විස්තර කරන්න.

(04) බෙර කඳෙහි දිග හා බෙර මුහුණතෙ හි විෂ්කම්භය කොපමණ ද?

(05) පහතරට බෙරයක් ඇඳ කොටස් නම් කරන්න.

නර්තනය

8 ශ්‍රේණිය.    11 - වාරය

ගුරුභවතාගේ නම : ඒ.වී.එස්.සී.ගුණසේකර    අම්/අඹගහවැල්ල ම.වි.

නිපුණතාව: 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 3.2 විධික්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි.

## සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය

සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය උඩරට පහතරට සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුනෙහිම බෙර පද දවුල් පද නිර්මාණය වී ඇත්තේ බීජාක්ෂර මුල් කර ගනිමිනි. පොදු වූ ධ්වනි හතරකි.එය බීජාක්ෂර ලෙස හැඳින්වෙන අතර ඒවා පදනම් කරගෙන උපදින අනෙකුත් අක්ෂර ගර්භාක්ෂර ලෙස හැඳින්වේ.

උඩරට නර්තන සම්ප්‍රදාය - තත් , ජිත්, තොං, නං

පහතරට නර්තන සම්ප්‍රදාය - තත් ,දිත් , තොං ,නං

සබරගමු නර්තන සම්ප්‍රදාය - තත් ,ජිත් ,තොං , නං

සතර බීජාක්ෂර වාදනය වන ආකාරය




තත් - බෙරයේ වම් ඇසට ඇඟිලි පුපුරා යන සේ ගසයි

ජිත් - බෙරයේ දකුණු ඇසට පුපුරා යන සේ ගසයි.

තොං - බෙරයේ වම් ඇසේ ගැටියට සුළඟිලි ප්‍රදේශයන් ගසයි.

නං - බෙරයේ දකුණු ඇසේ ගැටියට සුළඟිලි ප්‍රදේශයෙන් ගසයි.

සතර බීජාක්ෂර වලට අමතරව අනෙකුත් අක්ෂරයන් (ගර්භාක්ෂර) වාදනයවන අයුරු දැනගත යුතු වේ.

- ගැට බෙරයේ වම් ඇස මුල් කරගෙන වාදනය වන අක්ෂර

  උදා; ගත් , ත, ග, තා

- ගැට බෙරයේ දකුණු ඇසින් උපදවා ගත හැකි අක්ෂර

  උදා; ජිං ,දං ,තං ;නං

සතර බීජාක්ෂර මුල් කරගත් සරඹ පද --- උඩරට නර්තන සම්ප්‍රදාය

- තත්කඩ ජික්කඩ තොංකඩ නංකඩ
- සුලු තනි තිතට බෙර පදය දොම්/කිට/කිට /දොම් - කුද /ගත/ගත/දොම්

<u>කාර්ය පත්‍රිකාව</u>

➢ හිස්තැන් පුරවන්න.

1. ගැට බෙරයේ උපදින මූලික බීජාක්ෂර වනුයේ ................................ යි.
2. මූලික බීජාක්ෂර වාදනයේදී බෙරයෙ වම් ඇසේ ගැටිය අසලට ඇඟිලි අගින්

   ගැසීමෙන් .......................................................... ශබ්දය නිකුත් වේ.
3. බෙරයේ ...................... ඇස මැදට හඩ විහිදෙන ලෙස පුපුරා

   ගැසීමෙන් .......................................... ශබ්දය නිකුත් වේ.
4. බෙරයේ ....................................... ඉහලට අත පුපුරා ගැසීමෙන් ජිත් යන ශබ්දය
5. බෙරයේ දකුනු ඇසේ ගැටිය අසලට සුලැඟිලි ප්‍රදේශයෙන් ගැසීමෙන් .....................

   ශබ්ධය නිපදවයි .

➢ පිළිතුරු ලියන්න

1.සතර බීජාක්ෂර යනු කුමක්දැයි විස්තර කරන්න.

2. ගර්භාක්ෂර 05ක් නම් කරන්න.

3.සතර බීජාක්ෂර මුල් වූ සරඹ පද වෙන වෙනම ලියන්න.

4.මාත්‍රා 2කේ තාලයට බෙර පදයක් ලියන්න.

නර්තනය

7 ශ්‍රේණිය. 11 - වාරය

ගුරුභවතාගේ නම : කේ.ජී. නදීකා නිමාලි රාජපක්ෂ අම්/පරගහකැලේ ම.වි

නිපුණතාව : 2 .0 නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.5 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

## වන්නම් නර්තනය කරමු

වන්නම් උඩරට , පහතරට , සබරගමු යන සම්ප්‍රදායන් තුනෙහිම පොදුවේ දක්නට ලැබෙන ගායනා සහිත සුවිශේෂ නර්තන විශේෂයකි.වන්නම් රචකයා විසින් තෝරා ගනු ලැබූ කවර හෝ ප්‍රස්තුතයක් පිළිබඳව කෙරෙන වර්ණනාවක් වන්නමේ ගයනයෙන් විස්තර කරයි.වන්නම් සම්ප්‍රදායන් තුනෙහිම පොදු වේ දක්නට ලැබුනද ප්‍රස්තුත , ආකෘතිය , ගායන , නාද මාලා ,අරමුණු ආදී අංගෝපාංගයන්ගේ සමානත්වයක් දක්නට ඇත.ශාන්ති කර්ම වලින් බැහැර වූ සබ නැටුම් විශේෂයක් ලෙස වන්නමින් හැඳින්විය හැකිය.

### උඩරට වන්නම්,

උඩරට සම්ප්‍රදායට අයත් වන්නම් 18කි. එසේ හෙයින් වන්නම් දහඅට , දහ අට වන්නම් ලෙසද හඳුන්වනු ලබයි. පිළිගත් සාම්ප්‍රදායික වන්නම් දහඅටට අමතරව එකිනෙක ගුරුකුල වලට ආවේණික අප්‍රචලිත වන්නම් හා මෑත භාගයේදී රචනා කරන ලද නවතම වන්නම්ද වේ.

- උඩරට සාම්ප්‍රදායික වන්නම් දහඅට මහනුවර රාජධානියේ රජ කළ ශ්‍රී වීර පරාක්‍ර නරේන්ද්‍ර සිංහ රජතුමාගේ කාලයේදී ගණිතාලංකාර බමුණු පඬිවරයෙක් හා රම්මොලෝවක අධිකාරම් විසින් රචනා කරන ලද බවට පිළිගැනීමක් පවතී.
- වන්නම් ශ්‍රී වීර පරාක්‍ර නරේන්ද්‍ර සිංහ රජතුමාගේ කවිකාර මඩුවේ ගායනය සඳහා රචනා වූ බවත් පසු කලෙකදී එයට නර්තනය එක් වූ බවත් කියවේ.
- උඩරට වන්නම් සතුන් , අවස්ථා , භෞතික වස්තු , දෙවිවරු , උපදේශන ආදී ප්‍රස්තුත වලට අනුව ලියවී ඇත.
- උඩරට වන්නමක් බෙර පදය , තානම , කවිය , කස්තිරම , සීරුමාරුව , අඩවුව යන කොටස් හයකින් සමන් විත ආකෘතියකින් නිර්මාණය වී ඇත.
- විනෝදාස්වාදය මුල් කරගෙන නර්තනය කරයි.

### තුරගා වන්නම,



- උඩරට වන්නම් 18ට අයත් තුරගා වන්නම සිදුහත් කුමරු ඡන්න ඇමති සමග කන්ථක අසුපිට නැගී ගිහිගෙයින් නික්ම යෑමේ පුවත නැතහොත් අභිනිෂ්ක්‍රමණය ප්‍රස්තුත කරගනිමින් නිර්මාණය වී ඇත.

තුරගා වන්නමට අදාළ පද කොටස් නර්තනය කිරීම ඔබ විසින් 7 ශ්‍රේණියේදී සාර්ථකව නිම කර ඇත. 8 ශ්‍රේණියේදී ඔබට නියමිතව ඇත්තේ තුරගා වන්නම අයත් කස්තිරම , සීරුමාරුව , අඩවුව සමග වන්නම නැවත සම්පූර්ණයෙන් නර්තනය කිරීම වේ.

<u>වන්නම නර්තනය කරමු.</u>

| | | |
|---|---|---|
| තිත | : | මාත්‍රා දෙක තුන දෙතිත තාල රූපය (සුළු මැදුම් දෙතිත) |
| තාල රූපය | : | 1 2 /1 2 3 |
| බෙර පදය | : | දොං ජිංත ගත දොංත |
| තානම | : | තත් තත් තනත් තනෙන තත් තත් තනත් තනෙන<br>තත් තත් තනත් තම්ද නා නා<br>තන තනෙන තන තනෙන තතන තම්දෙන තනෙන<br>තානත් තනත් තම්ද නා නා |
| කවිය | : | සත්වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු<br>ගත් සිත් තොසත් පැවිදි අංහා<br>අණ කරන ඡන්න යෙන කන්ථක අසු ගෙනෙන<br>ගෙන යෙදුන අසුගෙ පිට නැංහා<br><br>ගත් ගත් පයත් අසුගෙ ශබ්දත් වසත් සුරිඳු<br>යන්නෙත් තොසින් තිදෙන සමහා<br>යන්න යනෙන කල තිදෙන එතැන තැන පසුව දැන්<br>ගං තෙරට පත් උණි ය එමහා<br><br>ලත් ලත් සිතත් තිදෙන වෙත් වෙත් එකත් පසුව<br>මුත් කනථකත් වෙය තුරහා<br>සිදුහතුන ගෙන වහන ඡන්න වලිගය අතින<br>පැනනෙන් එතෙර අනොම ගංහා<br><br>ගොක් සිත් මහත් රුසිරු ලත් යුත් සිදත් කුමරු<br>ගෙන් සෙත් රුගත් නෙර්ත අංහා<br>තිදෙනත් පැන ගිය ගණින එතැන අණ ගෙන බැතින<br>යෙදුව නැණ වර්ණයෙන තුරහා |
| කස්තිරම | : | කුඳ ගජිත කුද ගජිත කුද ගජිත කුද තා//<br>කුඳ ගජිත කුද තා//<br>කුඳ තා කුඳ තා//<br>කුඳ ගජිත කුද ගජිත කුද ගජිත කුද තා |
| සීරු මාරුව | : | කුඳ ගජිජි ගත දොංත ගජ්ජිත් ගජිං ජිකු ද<br>කුඳ ගජිත ගත දොංත දොංත තා. |
| අඩව්ව | : | තත් තකට තක රොං<br>තක්කඩ තක්කඩ කුද තක රොං<br>තක රොං ගජිං ජිකුද කිටි තකට කුංදත්<br>ජික රොං |

**වන්නම අභ්‍යාස කිරීමේදී,**

- බෙර පදය , කස්තිරම් , සීරුමාරු , අඩව් නියමිත තාල තබා ගනිමින් කියන්න.
- ගුරුවරයා නර්තනය කර පෙන්වන ආකාරය හොඳින් නිරීක්ෂණය කරන්න.
- වන්නමට අදාල තාල රූපය අංගහාර නිවැරදිව පවත්වා ගන්න.

## කාර්ය පත්‍රිකාව

1. සම්ප්‍රදායන් තුනෙහිම දක්නට ලැබෙන සබ නැටුම් විශේෂයකි.
   1) වන්නම් 2) ගැමි නැටුම් 3) පතුරු 4) කාවඩි
2. උඩරට වන්නම් මුල් කාලයේදී රචනා වූයේ
   1) පෙරහැර සඳහා 2) ගම් වැසියන් සඳහා
   3) ගායනය සඳහා 4) නර්තනය සඳහා
3. උඩරට වන්නම් රචනා කරන ලද්දේ ,
   1) වැත්තැවේ හිමි 2) ශ්‍රී පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජු
   3) රම් මෝලවක අධිකාරම් 4) බරණ ගනිතයා
4. තුරගා වන්නමේ ප්‍රස්තුතය වන්නේ
   1) වදුරෙක්ගේ ගති ලක්ෂණ 2) ඊෂ්වර හා කේතු අතර සංවාදය
   3) අශ්වයාගේ ගති ලක්ෂණ 4) සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය
5. උඩරට වන්නම් වල දැකිය නොහැක්කේ
   1) සත්ව චරිත 2) දේව චරිත 3) යක්ෂ චරිත 4) සිදිධි හා වස්තු

- හිස්තැන් පුරවන්න
  1. උඩරට වන්නම් ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර රජුගේ ......................................... ගායනය පිණිස රචනා විය
  2. වන්නම් රචනා කිරීම සඳහා ගනිතාලංකාර පබුණු පඩිවරයා හා .......................................... දායකත්වය දක්වා ඇත.
  3. උඩරට සම්ප්‍රදායට අයත් වන්නම් ගණන .................................... කි
  4. ................................ නැටුම් විශේෂය ලෙස වන්නම් හඳුන්වා දිය හැකිය .
  5. උඩරට වන්නමක් අවසන් කරනුයේ .................................. නර්තනය කිරීමෙනි.

- පිළිතුරු ලියන්න.
  1. තුරගා වන්නමේ තාල රූපය ලියන්න
  2. තුරගා වන්නමේ බෙර පදය කිමක් ද?
  3. තුරගා වන්නමේ කස්තිරම ලියන්න.

- යා කරන්න

| | | |
|---|---|---|
| වන්නම් | බෙර පදය | කස්තිරම |
| හනුමා | දොංජිංත ගත දොංත | රුදගත ගත |
| වෛරොඩි | කුදගත ගත දොම් | රුංතක ජිංතක |
| තුරගා | ජිංගත ගොගො | කුද ගජිත කුද ගජිත |

- වන්නමට අදාළ සියළු කවි සමඟ වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරන්න.

නර්තනය

8 ශ්‍රේණිය.  11 - වාරය

ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.සුරංගා කසුන්මාලි  අම්/පාදාගොඩ විද්‍යාලය

නිපුණතාව: 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම : 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරයි.

## ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමර්ශනයේ දී කිසියම් නර්තන කලාවක් අතීතයේ සිට පැවති බවට සාධක හඳුනා ගත හැකිය. ඉතිහාසගත කරුණු අනාවරණය සඳහා මූලාශ්‍ර පාදක කර ගනියි.පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර යටතේ විමසන කල්හි රූකම් ඇසුරෙන් නර්තන කලාව පැවති බවට සාදක රාශියක් හඳුනා ගත හැකිය.

රූකම්
- ගල් කැටයම්
- ලී කැටයම්
- සිතුවම්
- මූර්ති

<table>
<tr><td rowspan="5">ගල් කැටයම්</td><td>ස්ථානය</td><td>තොරතුරු ( සාධකය)</td></tr>
<tr><td><br>ලෝවාමහාපාය</td><td>• ගල්ටැම් පේකඩ ආදියෙහි බෙර වයන කළගෙඩි කෙළියෙහි යෙදෙන උඩැක්කි වයන තාලම්පට වයන අය දැක්වෙති.</td></tr>
<tr><td><br>මිහින්තලේ කණ්ඨක චෛත්‍යය</td><td>• වාහල්කඩ</td></tr>
<tr><td><br>මැදිරිගිරිය වටදාගෙය</td><td>• කණුවල උඩැක්කිය හා එකැස් බෙර දක්නට ඇත.</td></tr>
<tr><td><br>යාපහුව දළදා මාලිගය ශෛලමය සෝපාන පන්තිය</td><td>• පාණ්ඩ්‍ය සම්ප්‍රදායට අනුව නිර්මිත නලු රූප ගණනාවකි.බෙර වයන හා නටන රූප ඇත.භරත නැටුමේ නර්තන විලාසවලට සමාන ය.(කරණ 108න් එක් ඉරියව්වකට) මිනිසෙකු දැතින් සිට දෙපා ඔසවා සිටින අතර බෙර වයන්නා ඊට අනුකූලව වයන ලක්ෂණයක් පෙන්නුම් කරයි.</td></tr>
</table>

| | | |
|---|---|---|
| ගල් කැටයම් |   කෑගල්ල දිස්ත්‍රික්කයේ අලවතුර ගමේ ගනේගොඩ විහාරය | • විහාර පාදමේ ශෛලමය නළඟන රූ පෙළක් ඇත. |
| |   ගඩලාදෙනිය විහාර ආලින්දයේ පාදම | • නළඟන රූපාවලියක් ඇත.නටන, වයන රූප මෙන්ම නළාව, උඩැක්කිය, රබාන, තාලම්පට වයන රූප ද එහි ඇතුළත් ව ඇත. |
| |   බෙන්තර ගලපාත විහාරය ගල් උලුවස්ස | • බෙර වාදක රූප, පිඹින ස්ත්‍රී රූප හා උඩරට නිළියකගේ රූපයක් ද දක්නට ඇත. |
| |  දෙවුන්දර උපුල්වන් දේවාලයේ ගල් උලුවස්ස | • වාමන රූප දෙකක් තිබේ. එක් රූපයක හොරණෑ පිඹින්නකු දැකිය හැකිය. |
| |  කෑගල්ල දිස්ත්‍රික්කයේ අම්බුලුගල වැම්පිට විහාරයේ ගල් උලුවස්ස | • නළඟන රූපයක් ඇත.<br>• ශ්‍රී පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද එහි රබාන හා හොරණෑව දැක්වෙන රූප කැටයම් කර ඇත. පුරුෂ නැටුම් වශයෙන් අනුමාන කළ හැකි සටහන් ඇත. නලු ආභරණ උඩරට නැටුම්හි අද දක්නට ලැබෙන නැටුම් විලාස හා ආභරණ ආදියට සමානතාවක් ඇත. |

| | ස්ථානය | තොරතුරු |
|---|---|---|
| ලී කැටයම් |   ඇම්බැක්ක දේවාලය | • බාල්කයක කැටයම් කර ඇති ලී කෙළි නැටුමකි.<br>• සිවුරස් ජනේලයක නිළියක මණ්ඩියට සිටින ආකාරය (භරත නැටුමේ අරමණ්ඩියට සමාන ය.) |
| |  ඇම්බැක්ක කතරගම දේවාලය | • නිළියක හා බෙර වයන්නකු සමඟ වෙස් තට්ටුව සහිත නලුවෙක් සිටියි. |
| |   කුරුණෑගල දිස්ත්‍රික්කයේ පනාපිටිය අම්බලම | • කණුවක වෙස් බැඳි නැට්ටුවෙකුගේ හා නිළියකගෙ රූපයක් කැටයම් කර ඇත. |

| | ස්ථානය | තොරතුර (සාධකය) |
|---|---|---|
| සිතුවම් |   සීගිරිය | • හරත නැටුමේ දී භාවිත කෙරෙන සම්යුත, අසම්යුත හස්ත මුද්‍රා රාශියක් දක්නට ඇත. උදා: මුකුල, අලපද්ම, කපිත්ත |
| |   මුල්කිරිගල | • නළඟන රූප හා භාණ්ඩ වාදනය කරන නළඟන රූප දැකිය හැකිය. උදා: පන්තේරු නැටුම |
| |  පොල්වත්ත පන්සල | • රබන් සහිත විරිදුකරුවන් දෙදෙනෙකුගේ චිත්‍රයකි. එක් නැට්ටුවකුගේ ඇඳුම් හා නර්තන විලාසය පහතරට නර්තන විලාස හා සමානකමක් පවතී. |

| | ස්ථානය | තොරතුර (සාධකය) |
|---|---|---|
| මූර්ති |    මිහින්තලේ | • සිංහ පොකුණු කටට උඩින් නළඟනකගේ රූපයක් තිබීම. |
| |  අනුරාධපුරයේ කුට්ටම් පොකුණ | • නළඟනකගේ නර්තන විලාසයක් දක්වන ලෝකඩ රූපයක් සොයාගෙන ඇත.එය ඉතා වේගයෙන් භ්‍රමණය වන අවස්ථාවක් පෙන්වයි. |
| |  දැදිගම කොටවෙහෙරේ සුතිඝර චෛත්‍ය | • ඇත් පහනේ නළඟනකගේ ලෝහමය රූපයක් ඇත. |
| |  පොලොන්නරුවේ අංක 2 ශිව දේවාලය | • ලෝකඩ නටරාජ පිළිරුවේ පාදමේ දැක්වෙන කැටයම් |
| |  ශිව දේවාලය | • තාණ්ඩව නර්තනයක නියැළී ශිව දෙවියන්ගේ රූපයෙහි එකැස් බෙරය, තාලම්පට, හොරණෑව, හක්ගෙඩිය ආදී වාද්‍ය භාණ්ඩ රූකම් අන්තර්ගත ව ඇත. |

කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර තෝරන්න

(01) නළඟන රූප දක්නට හැකි වන ස්ථානයක් නොවන්නේ,

(1) ගනේගොඩ විහාරය (2) ගඩලාදෙනිය විහාර ආලින්දයේ පාදම

(3) මිහින්තලේ කණ්ඨක චෛත්‍යය (4) මුල්කිරිගල

(02) කඤ්චුවක වෙස් බැඳි නැට්ටුවෙකුගේ හා නිළියකගේ රූප කැටයම් කර ඇති ස්ථාන දෙකක් ඇතුළත් වන්නේ,

(1) ලෝවාමහාපාය, පනාපිටිය අම්බලම (2) ඇම්බැක්ක කතරගම දේවාලය, ගනේගොඩ විහාරය
(3) අම්බුලුගල ටැම්පිට විහාරය, ලෝවාමහාපාය (4) පනාපිටිය අම්බලම, ඇම්බැක්ක කතරගම දේවාලය

(03) වේගයෙන් භ්‍රමණය වන නළඟනකගේ රූපයක් හමු වී ඇත්තේ,

(1) ලෝවාමහාපායෙන් (2) අනුරාධපුරයේ කුට්ටම් පොකුණෙන්

(3) මිහින්තලයෙන් (4) ශිව දේවාලයෙන්

(04) කරණ 108න් එක් ඉරියව්වකට සමාන මිනිස් රූපයක් දක්නට ලැබෙන ස්ථානයකි,

(1) මැදිරිගිරිය වටදාගෙය (2) යාපහුව දළදා මාලිගය

(3) පනාපිටිය අම්බලම (4) ගඩලාදෙනිය විහාරය

(05) ඇත් පහනේ නළඟනකගේ ලෝහමය රූපයක් දක්නට ලැබෙන්නේ,

(1) දැදිගම කොටවෙහෙරේ (2) දෙවිනුවර දේවාලයේ

(3) අම්බුලුගල ටැම්පිට විහාරයේ (4) බෙන්තර ගලපාත විහාරය

➢ හිස්තැන් පුරවන්න.

(06) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර යටතේ............................................... ඇසුරෙන් නර්තන කලාව පැවති බවට සාධක හඳුනා ගත හැකිය.

(07) කඤ්චුවල උඩැක්කිය හා එකැස් බෙර දක්නට ලැබෙන ස්ථානයකි..................................................

(08) පහතරට නර්තන විලාසය හා සමාන නැට්ටුවෙකුගේ රූපයක් .................................. දක්නට ලැබේ.

(09) .......................................බාල්කයක කැටයම් කර ඇති ලී කෙළි නැටුමක් දක්නට ලැබේ.

(10) සම්යුත, අසම්යුත හස්ත මුද්‍රා රාශියක් ............................ බිතු සිතුවම්වල දක්නට ලැබේ.

➢ නිවැරදි පිළිතුරු සපයන්න.

(01) අතීතයේ වාද්‍ය භාණ්ඩ භාවිත කළ බවට සාක්ෂි දැක්විය හැකි සාධක තුනක් ලියන්න.

(02) නර්තනයන් සඳහා කාන්තාවන් සහභාගි වී ඇති බවට කරුණු අනාවරණය කෙරෙන සාධක තුනක් ලියන්න.

(03) ගල් කැටයම්, ලී කැටයම්, සිතුවම්, මූර්ති යන රූකම්වලින් ඔබ කැමති රූකම් වර්ගයක් තෝරා ගෙන එකල නර්තනය පැවති ස්වභාවය පිළිබඳ අවම වශයෙන් සාධක 03ක් ඇසුරෙන්වත් විස්තර කරන්න.

(04) "නර්තන කලාවට භාරතීය ආභාසය ලැබී ඇති බවට කරුණු හෙළිවේ." සාධක දෙකක් ඇසුරෙන් මෙම කියමන සනාථ කරන්න.

(05) ආගමික අවස්ථා සඳහා නර්තනය යොදා ගත් බවට සාධක දෙකක් ඇසුරින් විස්තර කරන්න.

| නර්තනය | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය. | 11 - වාරය | |
| ගුරුභවතාගේ නම : ඒ.වී.එස්.සී.ගුණසේකර | | අම්/අඹගහවැල්ල ම.වි. |

නිපුණතාව : 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතා මට්ටම : 6.3 විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි .

## නවරාත්‍රී උත්සවය

- ✓ නව රාත්‍රී උත්සවය හින්දු බැතිමතුන්ගේ (ද්‍රවිඩ) ඉතාම උසස් ප්‍රධාන ආගමික උත්සවයකි . දින නවයක් පුරාවටම රාත්‍රී භාගයේදී දෙවියන් වෙනුවෙන් පැවැත්වෙන බැවින් මෙම උත්සවය නව රාත්‍රී උත්සවය ලෙස හඳුන්වයි අස්වනු නෙලන කාලයේදී මෙය පවත්වයි.

- ✓ නව රාත්‍රී උත්සවය පැවැත්වීමේ හේතු ලෙස දෙවියන් පිදීම , සශ්‍රීකත්වය හා සෞභාග්‍ය ප්‍රාර්ථනා කිරීම, අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම ආදිය පෙන්වා දිය හැක.

- ✓ නව රාත්‍රී උත්සවයේ පුද ලබන දෙවිවරු ලෙස දුර්ගා දේවිය , ලක්ෂ්මී දේවිය , සරස්වතී දේවිය යන දෙවියන් තිදෙනා ප්‍රධාන කොට ගෙන දින 9 ක කාලයක් මෙම උත්සවය පවත්වයි.

- ✓ දින නවයක් පැවැත් වූ පූජාවෙන් පසු දස වන දිනයේදී පවත්වන පූජාව "විද්‍යා ආරම්"භය හෙවත් "විජය දසම්" ලෙස හඳුන්වයි .

## ආගමික පසු බිම

- ✓ ප්‍රථම දින තුන බලයට ශක්තියට අධිපති දුර්ගා දේවිය උදෙසා පුද පූජා පවත්වයි. විටෙක "කාලි අම්මාන්" ලෙසත් "පාර්වතී දේවි" ලෙසත් පුද පූජා ලබයි බලය හා ශක්තිය ප්‍රාර්තනා කරයි .



- ✓ දෙවන දින තුන දනය හා දියුණුව ලබා ගැනීමේ දැඩි අපේක්ෂාවෙන් ලක්ෂ්මී දේවිය වෙනුවෙන් පුද පූජා පවත්වයි .

.

- ✓ අවසාන දින තුන ශාස්ත්‍ර කලා දියුණුව මුදුන් පත් කර ගැනීම සඳහා කලාවට අධිපති සරස්වතී දේවියට පුද පූජා පවත්වයි .

.

- ✓ දින නවයෙන් පසු දහ වන දිනයේදී අධ්‍යාපන කටයුතු ආරම්භ කරන පූජාව " විජය දසම්" පූජාව නම් වේ .

.

- ✓ අවුරුදු තුනෙන් පහළ කුඩා දරුවන් සඳහා තැටියක් මතට හාල් දමා ඒ මත අකුරු ලියා ඉගැන්වීම ආරම්භ කරයි .

- ✓ විජය දසම් රාත්‍රී පූජාව පවත්වන අවස්ථාවේ විවිධ කටයුතු වල යෙදෙන අය තමාට අදාල උපකරණය අතේ තබා ගෙන පැවැත්වීම සිදු කරයි .

## <u>නව රාත්‍රී උත්සවයේ නර්තන, ගායන , වාදන අවස්ථා</u>

- ✓ මෙයටම ආවේනික වූ විශේශ නර්තන අංග නොමැති අතර ද්‍රවිඩ ජනයාට ආවේණික වූ නර්තන සම්ප්‍රදාය භාවිතා කරයි .

- ✓ ගායන අවස්ථා ලෙස දෙවියන් උදෙසා තේවාරම් නම් ගායනා විශේෂයක් ගායනා කරන අතර "සකලකලා වල්ලිමාලෙයි" නමැති ගායනයක් සිදු කරයි .

- ✓ වාදන අවස්ථා ලෙස බිම වාඩි වී තවිල් බෙරය වාදනය කරන අතර සුවිශේෂී පද කොටස් ස්තෝත්‍ර ගායනා සමග වාදනය කරයි .

<u>සැරසිලි</u>

- කොටස් 2 කි. 1 හින්දු කෝවිල් සැරසීම 2 .නිවෙස් සැරසීම

➢ කෙසෙල් ගස් කෙසෙල් කැන් ආදිය යොදා ගනිමින් හින්දු කෝවිල් සරසා ගනු ලබයි.
.

➢ කොලු ලෙසින් හඳුන්වනු ලබන තට්ටු 9 යුත් ආසනය ප්‍රධාන සැරසිල්ලයි.





<u>කාර්ය පත්‍රිකාව</u>

➢ හිස්තැන් පුරවන්න .

1.නව රාත්‍රී උත්සවය පවත්වනු ලබන්නේ ....................... ජනතාවයි.

2.නව රාත්‍රී යනුවෙන් හඳුන්වනු ලබන්නේ පුරා........................... ක් පවත්වන නිසාය.

3.10 වන දිනයේදි අධ්‍යාපන ආරම්භ වීම ...................... පූජාව නම් වේ.

4.මෙහි ස්තෝත්‍ර ගයනා වලදී යොදා ගන්නා වාද්‍ය භාණ්ඩය වනුයේ ....................... බෙරයයි .

5.නිවෙස් වල නිර්මාණය කරන තට්ටු 9 න් යුත් සැරසිල්ල................ නමින් හැඳින්වේ.

➢ පිළිතුරු සපයන්න.

1.නව රාත්‍රී උත්සවය පැවැත්වීමේ අරමුණු මොනවද ?

2.මෙහිදී පුද ලබන දෙවිවරු කවුරුන් ද ?

3.නිවෙස් හා දේවාල වල සැරසිලි පිළිබඳ හැඳින්වීමක් කරන්න.

4.මෙම උත්සවයේ ආගමික පසුබිම පිළිබඳ විස්තර කරන්න.

5.විජයදසම් පූජාවේදී සිදු කරනු ලබන්නේ කුමක් ද?

නිපුණතාව : 2.0 නර්තනය හා බැදි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.6 - විධි ක්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.

## වෛරෝඩි වන්නම ප්‍රස්තාර කිරීම

| | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය තානම | ජිං | - | ග | ත | ගො | ගො | ජිං | - | ග | ත | ගො | ගො |
| | + | තතෙ | ත | ත | තෙ | ත | ත | තෙ | ත | ත | තා | - |
| | තා | තා | තෙයි | තා | තා | තෙයි | තා | තා | තෙයි | ත | තා | - |
| | + | තතෙ | ත | ත | තා | - | තා | තා | තෙයි | ත | තා | - |
| | තා | තත් | තෙයි | තත | තම් | දත | තම් | ද | - | - | - | - |
| | + | තා | තම් | ද | තා | - | තා | - | - | - | - | - |
| කවිය | + | අග | ය | ච | ඩ | න | ක | වි | ච | රූ | තා | - |
| | ර | ශ්‍රී | ය | දු | තෙයි | - | ක | ළ | ර | ච | තා | - |
| | + | මට | උ | ර | තා | - | තො | ච | මෙ | දී | තා | - |
| | ම | හ | තු | ගෙ | අ | ච | ස | ර | - | - | - | - |
| | + | රැගෙ | න | ස | මා | - | චා | - | - | - | - | - |
| කස්තිරම | රුං | ගත | ගත | ගත | කුකු | දත් | ගජිං | ත | ගත් | ජින් | කුන් | දත් |
| | තකු | දග | ජිං | තකු | දග | ජිං | තක | තක | තරි | කිට | කුඳ | කුඳ |
| | ගජිං තා | ත | ගත් | ජිත් | කුන් | දත් | තකු | තක | තරි | කිට | කුන් | දත් |

## තුරඟා වන්නමේ සීරුමාරුව හා අඩව්ව

| | ^ | | / | | | ^ | | | / | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| සීරු | කු | ඳ | ග | ජි | ත | ග | ත | දොං | - | ත |
| මාරුව | ගජ් | - | ජිත් | - | ග | ජිං | - | ජි | කු | ඳ |
| | කු | ඳ | ග | ජි | ත | ග | ත | දොං | - | ත |
| | දොං | - | තා | | | | | | | |
| අඩව්ව | තත් | - | ත | ක | ට | ත | ක | රොං | - | - |
| | තක් | කඩ | තක් | කඩ | කුඳ | ත | ක | රොං | - | - |
| | ත | ක | රොං | - | ග | ජිං | - | ජි | කු | ඳ |
| | කි | ටි | ත | ක | ට | කුං | - | දත් | - | - |
| ▯▯▯▯ | ජි | ක | රොං | - | - | | | | | |

| / | | | / | | | / | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | |
| සො | ළ | සා | - | සං | - | බ | ය | ප | ළ | මු | ව | |
| පෙ | රුම් | - | පි | රු | - | බ | ල | යෙන් | - | දා | - | |
| මෙ | ලෙ | ස | මු | නි | ඳු | ව | ප්‍රා | - | - | ස | ත | |
| වැ | ඩ | හි | ඳ | කෙ | ලෙ | සුන් | - | බින් | - | දා | - | |
| - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| ක | ල | ස | ඨ | ශෙ | ත | මි | හි | ක | ත | දො | ස් | |
| කී | - | අ | නු | හස් | - | බ | ල | යෙන් | - | දා | - | |
| සි | ර | ස~ | න | ළ | ල | පැ | මි | ණි | දෝ | - | ස | |
| ඳු | ර | ලන් | - | මු | නි | බ | ල | යෙන් | - | දා | - | - |
| - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

මෙලෙස එදා නිරිඳු සදා කළිඟු වැදා නුවර සාගතයක් සැදුනේ යන කවිය ද මැදුම් තනි තිතට ප්‍රස්තාර කල හැකිය.

## සවරං කවි ප්‍රස්තාර - මාත්‍රා 3 තාලය

| / | | | / | | | / | | | | | / |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | | 3 1 | 2 | | 3 1 | 2 | 3 |
| පැ | වි | ය | ග | ල් | ඨ | හැ | න් | ජ | ය | ඨ | ස් |
| ව | ඩි | ත් | ත | ට | - | - | - | - | - | - | - |
| වි | රි | ය | ක | ර | සි | කි | ත් | ග | ත | ඳු | රු |
| හ | රි | ත් | ත | ට | - | - | - | - | - | - | - |
| කා | රි | ය | ක | ම | යි | ස | ව | ර | ත් | ගෙ | න |
| ර | ග | ත් | ත | ට | - | - | - | - | - | - | - |
| සූ | රි | ය | දෙ | වි | ර | ජු | නි | අ | ව | ස | ර |
| දෙ | ව | ත් | ම | ට | - | - | - | - | - | - | - |

## සවරං කවි ප්‍රස්තාර - මාත්‍රා 4 තාලය

| | / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| + | මල් | | ග | ව | සා | - | ලා | - | කොන් | - | ඩ | ය | බැ | ද | ලා | - |
| + | ඉත | | ත | ද | ක | ර | ස | එ | පැ | ළ | ද | ගෙ | තේ | - | - | - |
| + | පිය | | යු | රු | නි | ම | ලා | - | එ | න | ලැ | ම | උ | දු | ලා | - |
| + | සලු | | ප | ට | කි | ක් | ව | ස | මි | න් | ය | සි | තේ | - | - | - |
| + | සිරි | | ය | ල් | දී | - | ලා | - | ක | ට | ර | තු | ක | ර | ලා | - |
| + | නා | | ද | එ | මෙන් | - | තො | ල් | දි | ලි | සෙ | මි | තේ | - | - | - |
| + | දෙවි | | ය | න් | වැ | ද | ලා | - | මෙ | ර | ග | ට | බැ | ස | ලා | - |
| + | ප | | ටත් | ග | නි | මු | ස | ව | රත් | - | රැ | ගෙ | තේ | - | - | - |

## පතුරු කවි ප්‍රස්තාර - මාත්‍රා 4 තාලය

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| + | සූ | රි | ය | කු | ල | ඇ | ති | හි | රු | දෙ | වි | යත් | - | තේ | - |
| + | පැ | වි | ය | අ | ණ | ස | ක | ලො | ව | ප | ව | කිත් | - | තේ | - |
| + | කා | රි | ය | ක | ර | වා | - | ප | හ | දා | - | දෙත් | - | තේ | - |
| + | පතු | රු | නැ | ටී | - | ම | ට | අ | ව | ස | ර | දෙත් | - | තේ | - |

### කාර්ය පත්‍රිකාව

➢ පහත වගන්ති හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.

01. ප්‍රස්තාරකරණය යනු බෙර පද, කවි, කස්තිරම් ප්‍රායෝගිකව භාවිතා වන අයුරු ලියා දැක්වීමයි. ( )
02. ප්‍රස්තාරකරණය තාලය පදනම් කරගෙන සිදුකෙරෙන ක්‍රියාවලියක් නොවේ. ( )
03. වෛරෝඩි වන්නමේ තාලරූපය මහ තනිතිත වේ. ( )
04. "තක් තකට තක රොං" තුරඟා වන්නමේ සීරුමාරුවයි. ( )
05. "තකුං ජිංජිං තකට දොං තක" තුරඟා වන්නමේ බෙර පදය යි. ( )

➢ නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

01. තිත් +
02. තෙයි U
03. නිශ්ශබ්දතාවය. ^
04. අදෙන අක්ෂර /
05. අක්ෂර කැටිකර දැක්වීම —

➢ මේවාට පිළිතුරු ලියන්න.

01. වෛරොඩි වන්නමේ බෙර පදය හා තානම ප්‍රස්තාර කරන්න.

02. තුරඟා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

03. ඔබ කැමති සිරසපාද කවියක් ප්‍රස්තාර කරන්න.

04. "දැතට ගන්නේ සවරං පවන් සලන්නේ
සරඹ පාන්නේ පා පොඩි දෙක හසුරන්නේ
ගිත කියන්නේ සුමිහිරි තාල වයන්නේ
සබයට එන්නේ සවරං නැටුම් නටන්නේ"

යන සවරං කවිය මාත්‍රා 3 තාලයට ප්‍රස්තාර කරන්න.

05. "ලොව සෙත් කරවන පත්තිනි සදිනේ
සළුවක් අරගෙන සළු සලමින්නේ
වෙනසක් නොසිතා මගෙ ගුරුවරුන්නේ
පතුරක් අරගෙන රඟනෙමු තොසිනේ"

යන පතුරු කවිය මාත්‍රා 4 තාලයට ප්‍රස්තාර කරන්න.

| නර්තනය | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය. | 11 - වාරය | |
| ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.ජී. චින්තා පෙරේරා | | අම්/ සද්ධාතිස්ස මහා විද්‍යාලය |

නිපුණතාව : 2.0 නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.6 විධි ක්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.

## සුළු මහ දෙතිතට පද ප්‍රස්තාර

ප්‍රස්තාරයක් යනු ලිඛිත සන්නිවේදන ක්‍රමයකි. නර්තන විෂයට අදාලව සලකන කල එමගින් සන්නිවේදනය කරනුයේ කිසියම් බෙර පදයක් කවියක් කවර තාල රූපයක් අනුව ගැයේ ද යන්නයි. ඔබමේ වන විට දෙතිතට අයත් තාල රූප මොනවාදැයි 7 ශ්‍රේණියේ දී උගෙන ඇත. දෙතිතේ තාල රූප අතරින් මෙහිදී අපගේ ක්‍රියාකාරකමට අදාල වන්නේ මාත්‍රා 2 + 4 තාල රූපයයි. එනම් සුළු මහ දෙතිතයි.

### මාත්‍රා 2 + 4 තාලයට බෙරපද ප්‍රස්තාර

| | ^ | | / | | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| උඩරට | දොං | - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග | ත |
| පහතරට | දොං | - | දොං | - | ග | ත | ගත් | - | දිත් | - | ත | කු |
| සබරගමු | ජිං | | ජි | මි | ත | ක | තත් | - | කි | ටි | ත | ක |

### මාත්‍රා 2 + 4 තාලයට කවි ප්‍රස්තාර

| ^ | | / | | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| ගුස් | - | වැල් | - | ව | ල | පි | පි | පි | නි | බ | ර |
| මල් | - | ලස් | - | ස | න | නෙ | ත | පි | න | ව | න |
| අ | තු | ඉ | ති | ව | ල | ආ | - | ඩම් | - | බ | ර |
| කුම් | - | පෙන් | - | ව | න | ලෙ | ස | හි | නැ | හෙ | න |
| මු | දු | ම | ද | න | ල | ලෙ | ස | පෙම් | - | බ | ර |
| ගෙ | න | සු | ව | දි | න | දු | ව | පැ | න | ය | න |
| රන් | - | ස | ම | න | ල | කැ | ල | සුන් | - | ද | ර |
| පෙ | ළ | සැ | දෙ | මි | න | ය | න | ලස් | - | ස | න |

## <u>2 + 4 තාලයට කස්තිරම් ප්‍රස්තාර</u>

| ^ | | / | | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| කු | ද | ග | ජි | ග | ත | කු | ද | ග | ජි | ග | ත |
| කු | ද | ග | ජි | ග | ත | කු | ද | තා | - | - | - |

<u>කාර්ය පත්‍රිකාව</u>

06. නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

1. 3 + 3 සුළු මහ දෙතිත
2. 2 + 3 මහ තනි තිත
3. 3 + 4 මැදුම් තනි තිත
4. 2 + 4 සුළු මැදුම් දෙතිත
5. 4 + 4 මැදුම් මහ දෙතිත

07. හිස්තැන් පුරවන්න,

1. ප්‍රස්තාරකරණය යනු ........................................... සන්නිවේදන ක්‍රමයකි.
2. තාලම්පටින් නිපදවන ධ්වනි දෙක ක්ෂණාන්ත හා ........................................... වේ.
3. කුද ගජිගත ගත ගජිගත යන බෙර පදය ............................................ දෙතිතට අයත් වේ.
4. “මාමා ආවා නෝනා කීවා” මෙහි ඇත්ලත් වන්නේ ............................................ අක්ෂර පමණක් වේ.
5. ලඝු අක්ෂරයට හිමි මාත්‍රා ගණන ............................... කි.

08. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,

1. සුළු මහ දෙතිතට බෙර පදයක් ප්‍රස්තාර කරන්න.
2. වන් නිල්ගෙල නිල් රල්වර ලින් තුල බිඟු ඇල්ලා
   වන් පුන්සඳ මෙන් රන්තඹ රින් පුල්වන් දුල්ලා
   කන් වැල්විදු සැල්මෙන් බිඟු කැල්මෙන් ගත නිල්ලා
   සුන්දර පැරකුම් රජුදිගු බැල්මෙන් සිත ලොල්ලා
   මෙම කවිය 2 + 4 තාලයට ගායනා කරන්න.
3. මල නොතලා රොන් ගෙන යන ලෙස බඹරු
   පිනි නොසලා තණපත් මත යන අයුරු
   රන මොනරා පිල් විදහා ලෙස මියුරු
   බල සකියනි ලිය රඟදෙන රඟ සොඳුරු
   මෙම කවිය 2 + 4 තාලයට ප්‍රස්තාර කරන්න.
4. සුළු මහ දෙතිතට කස්තිරමක් ප්‍රස්තාර කරන්න.
5. සුළු මහ දෙතිතට ඔබ දන්නා රබන් පදයක් ප්‍රස්තාර කරන්න.

| නර්තනය | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය. | 111 - වාරය | |
| ගුරුභවතාගේ නම: | ආර්.එම්.සී. රාජපක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය, අම්පාර. |

නිපුනතාව : 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම: 1.2 භාව ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපනය කරයි.

## " භය" නමැති ස්ථායිභාවය නිරූපනය කරමු.

රසයක් උපදින්නේ භාවයක් මුල් කොට ගනිමිනි. පුද්ගලයෙකුගේ සිතෙහි පවතින හැඟීම් සමුදාය ස්ථායි භාව නමින් හැඳින්වෙන බවත් භරත මුණි පඩිවරයා පෙන්වා දී ඇත. ඒ අනුව භය නමැති ස්ථායි භාවයෙන් ප්‍රදර්ශනය වන්නේ ' භයානක' රසයයි.

❖ භය නමැති ස්ථායි භාවය ඉස්මතුවීම සඳහා බලපාන අත්දැකීම් කිහිපයක් නම්,

තද වර්ෂාවකදී එන අකුණු හඬ

මධ්‍යම රාත්‍රියේ සොරුන් කණ්ඩායමක් නිවසට ඇතුලුවීම.

කහ ඉර හරහා පාර මාරුවීමකදී හදිසියේ වාහනයක් තමා අසල තිරිංග තද කිරීම.

විෂකුරු සර්පයකු දැකීම.

පෙරහැර අවස්ථාවකදී ඇතෙකු කුලප්පු වීම ආදී අවස්ථා.



මෙවැනි අවස්ථාවකදී 'භය' නමැති භාවය සඳහා මූලික වන ශරීර කොටස් වන අංග, ප්‍රත්‍යාංග, උපාංග තුලින් දැකිය හැකි විවිධත්වයන් නම්,

- ඇස් විශාල වීම , කඳුළු ඉනීම හා ඇස් බෝලය දෙපසට ගමන් කිරීම.
- අත් පා දරදඬු වීම , දහඩිය දැමීම රෝමකූප කෙලින් වීම.
- මුව විවර වීම .
- උරහිස් බෙල්ල හැකිලීම.



කාර්ය පත්‍රිකාව

1 . මිනිස් සිතෙහි උපදින ස්ථායි භාවයන් පිළිබඳ හඳුන්වා දී ඇත්තේ,

1. රම්මොළවක අදිකාරම් තුමා 2. හරණ ගණිත පඬිතුමා

3. භරත මුණිවරයා 4. පනී භාරතයන්

2. භාවයන් ඉපදීමට හේතු විය හැක්කේ,

1. සිතිවිලි 2. බුද්ධිය 3. දැනීම 4. ලේ ගමනය

3. රසයක් උපදින්නේ ,

1. පංචේන්ද්‍රයන් මුල්කොට ගෙන 2. අංගයන් මුල් කොට ගෙන

3. භාවයන් මුල් කොට ගෙන 4. චලනයන් මුල් කොට ගෙන

4. 'භය' භාවය නිරූපනයේදී ශරීර ලක්ෂණයක් වන්නේ,

1. ඇස් කුඩා වීම 2. මුව විවර වීම 3. අත් පා හැකිළීම 4. බෙල්ල ඇලවීම

5. ඔබ උගත් රස භාවයන් ඇසුරෙන් පහත වගුව පුරවන්න.

| අවස්ථාව | භාවය | රසය |
|---|---|---|
| 1. හිමිදිරි උදයක පරිසරය දැකීම | | |
| 2. ග්‍රීස් ගහේ නැග කොඩිය අතට ගැනීම | | |
| 3. වැසි සමග විදුලි කෙටීම | | |
| 4. විභාගය සමත්වීම | | |
| 5. අවි අමෝරාගත් අයකු ඉදිරියට පැමිණීම | | |
| 6. ඔබ විසින් දියේ ගිලෙන අයෙකු බේරා ගැනීම | | |

✓ කෙටියෙන් පිළිතුරු සපයන්න.

1. භාව ප්‍රකාශනයේදී ශරීරය බෙදෙන ප්‍රධාන කොටස් 3 නම් කරන්න.

2. 'භය' නමැති ස්ථායි භාවය නිරූපනයේදී ඇති වන රසය කුමක්ද .

3. 'භය' භාවය නිරූපනයේදී ශරීරය තුළින් දැකිය හැකි ලක්ෂණයන් 4 ක් ලියන්න.

4. ' භය' භාවය මුල් කොටගෙන උපදින රසය, උද්දීපනය සඳහා මුල් විය හැකි දෘෂ්‍ය මානවිය හැකි අවස්ථා 3 ක් ලියන්න.

5. මෙම භාවය නිරූපණයට සුදුසු සිද්ධියක් කෙටියෙන් ලියා දක්වන්න.

| නර්තනය | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය. | 111 - වාරය | |
| ගුරුභවතාගේ නම : H.M. නදීකා ශිරෝමි | | අම්/සේනාගම මහ විද්‍යාලය |

නිපුණතාව: 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම :5.2 ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි.

## දෙවොල් මඩු ශාන්ති කර්මය

### ශාන්තිකර්ම යනු,

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයෙකුගේ මානසික හෝ කායික හෝ සුභසිද්ධිය අරමුණු කොට දෙවියන් යක්ෂයන් නැතහොත් වෙනත් බලවේග දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

### පහතරට දෙවොල් මඩු ශාන්තිකර්මය පැවැත්වීමට හේතු වූ කරුණු

| අතීතයේ පැවැත්වීමට හේතුව | වර්තමානයේ පැවැත්වීමට හේතු |
|---|---|
| සේරමාන් රජුගේ හිසරදය සුවපත් කිරීම. | • වසංගත රෝග සුවපත් කිරීම ,<br>• ගමට ප්‍රදේශයට රටට පැමිණි ව්‍යවසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම,<br>• සශ්‍රීකත්වය හා සෞභාග්‍ය උදා කර ගැනීම,<br>• ස්වාභාවික විපත් වලින් ආරක්ෂා වීම,<br>• අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා. |

### පුදලබන දෙවිවරු

- පත්තිනි දේවතාවිය
- දෙවොල් දෙවියන්
- වාහල දෙවියන්
- දොලහ දෙවියන්

### ප්‍රචලිත ප්‍රදේශ

ගාල්ල , මාතර , ගම්පහ , කොළඹ , කළුතර , හම්බන්තොට , රයිගම් කෝරළය , පස්දුම් කෝරළය , සියනෑ කෝරළය

### පුරාවෘත්තය

සේරමාන් රජුගේ උයන පාළුකරමින් සිටි ගෝනකු මරා දමන ලෙස රජු අණ කරන ලදි. රජු කෙරෙහි වෛරයෙන් මිය ගිය ගෝනා පොකුණෙහි මැඩියෙකු වී ඉපදුනේය. මගුල් පොකුණෙහි පිපි මහනෙල් මලක් සිඹිද්දී මැඩියා රජුගේ නාසයට ඇතුළු විය. ඉන් රජුට හිස රදයක් වැළදිණි රජු සිහිනයෙන් රූමත්කාන්තාවක් දැක පුරෝහිතයන්ගෙන් විමසීමේ දී ඔවුන් පවසා සිටියේ, ඒ පත්තිනි දේවතාවිය බවයි.පසුව ලංකාවේ රුවන්වැල්ල ප්‍රදේශයේ පත්තිනි දේවතාවිය වෙනුවෙන් කරන ලද ශාන්තිකර්මය නිසා රජුගේ හිසරදය සුව විය මෙම ශාන්ති කර්මය පසු කලෙක දෙවොල් මඩුව / පහන් මඩුව නමින් ප්‍රචලිත විය.

**ප්‍රධාන ඇඳුම් කට්ටලය** **ප්‍රධාන වාද්‍ය භාණ්ඩය**

තෙල්මෙ ඇඳුම් කට්ටලය







**දෙවොල් මඩු සැරසිලි අංග**



**පූර්ව චාරිත්‍ර**

- අක්යාල වෙන් කිරීම.
- ගස් වෙන් කිරීම.
- පඬුරු බැඳීම.
- මිල්ල කැපීම
- හඟල පේ කිරීම

**මඩු දිනට පෙර දින සහ මඩු දින චාරිත්‍ර**

- මඩු පේ කිරීම.
- තොට පේ කිරීම (තොට මෙට යෑම)
- මිල්ල කැපීම.
- හඟල පේ කිරීම
- තෙල් වැඩමවීම

සැරසිලි

- පත්තිනි තොරණ
- දෙවොල් තොරණ
- මල් යහන් (දෙවිවරුන්ට)
- බිසෝ කප
- කාල පන්දම් ගස

වාදන අවස්ථා

- මඟුල් බෙර
- පිං බෙර

**ගායනයට ප්‍රමුඛතාව හිමි වන අවස්ථා**

- හඟල පේ කිරීම.
- දළුමුර
- බිසෝ කප සිටුවීම

නර්තනය ප්‍රමුඛව යෙදෙන අවස්ථා

- තෙල්මේ නැටුම
- දෙවොල් නැටුම
- වාහල නැටීම
- යහන් දැක්ම

**ගායනය සමග යෙදෙන නර්තන**

- දොළහ පෙළපාලිය
- තොරන් යාගය
- පත්තිනි පද නැටීම

**නාට්‍යමය පෙළපාළි**

- අඹ විදමන
- මරා ඉපැද්දීම
- ඇත් බන්දනය
- මී බන්දනය

**ඒකල නර්තන**

- වාහල නැටීම
- පත්තිනි නැටීම
- කොතල පදය

**සමූහ නර්තනය**

- තෙල්මේ
- තොරන් යාගය
- යහන් දැක්ම.

## කාර්ය පත්‍රිකාව

1. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය වනුයේ
   1. දෙවොල්මඩුව — 2. පහන්මඩුව
   3. කොහොඹායක් කංකාරිය — 4. කිරිමඩුව

2. දෙවොල්මඩු ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණක් නොවන්නේ,
   1. ශස්ත්‍රීකත්වය ලභාකර ගැනීම — 2. අස්වනු සරුසාර කරගැනීම
   3. වසංගත උවදුරු මර්ධනය — 4. දරුඵල අපේක්ෂාව

3. දෙවොල්මඩු ශාන්තිකර්මය ප්‍රචලිත ප්‍රදේශ ලෙස
   1. ගාල්ල, මාතර — 2. උඩුනුවර, දුම්බර
   3. රත්නපුර, පැල්මඩුල්ල — 4. සතරකෝරළය, මාතර

4. දෙවොල්මඩු ශාන්තිකර්මයේ පුදලබන දෙවිවරු වන්නේ,
   1. කොහොඹා දෙවි තුන්කට්ටුව, වීරමුණ්ඩ දෙවි
   2. රුප්පායකුන්, කන්දෙ බන්ඩාර
   3. පත්තිනි දෙවි, දෙවොල් දෙවි
   4. අමරාපති , මහ කොහොඹා

5. දෙවොල්මඩු ශාන්ති කර්මයේ පුරාවෘතය ලෙස,
   1. මලය රජුගේ දිවි දෝෂය — 2. සේරමාන් රජුගේ කතාපුවත
   3. පත්තිනි පාලඟ කතාපුවත — 4. පඬුවස් දෙව් රජුගේ දිවි දෝෂය

6. සේරමාන් රජුට වැළඳි රෝගය ............................. නම් විය.

7. දෙවොල් මඩුවේ ප්‍රධාන වශයෙන් ........................... දෙවියන් පුද ලබයි.

8. දෙවොල්මඩු ශාන්ති කර්මයේ ප්‍රධාන ඇදුම් කට්ටලය ..................... වේ,

9. දෙවොල් මඩු ශාන්ති කර්මයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ............................. වේ,

10. දෙවොල් මඩු ශාන්ති කර්මයේ සැරසිළි අංගයකි.................................

11. දෙවොල් මඩු ශාන්ති කර්මය පැවැත්වීමේ මූලික අරමුණු මොනවා ද?

12. මෙම ශාන්ති කර්මයේ උපත් කතාව කෙටියෙන් ලියන්න.

13. මෙම ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි පහක් නම් කරන්න.

14. මෙම ශාන්ති කර්මයේ වාදන අංග මොනවා ද?

15. මෙම ශාන්ති කර්මයේ සැරසිළි අංග පිළිබඳ හැඳින් වීමක් කරන්න.

නර්තනය

8 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : කේ.ජී. නදීකා නිමාලි රාජපක්ෂ අම්/පරගහකැලේ ම.වි

නිපුණතාව : 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැදි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුම රක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම :- 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

## නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන් අගයමු.

### එස් පණීභාරත ගුරුතුමා




- කැගල්ල දිස්ත්‍රික්කයේ සතර කෝරළයේ අල්ගම ග්‍රාමයේ උපත ලද එස් පණීභාරත මහතාගේ මුල් නම වූයේ පානිස් ය. 1920 පෙබරවාරි 24 වෙනි දින උපත ලද මෙතුමා නර්තන කලාව ඉගෙනුමට ප්‍රවේශ වන්නේ වයස අවුරුදු 5ත් 6ත් අතර කාලයේදීය. මෙතුමාට වැඩිමහල් සොහොයුරියන් හා බාල සහෝදරයන් තුන් දෙනෙක් ද එක් බාල සොහොයුරියක ද සිටි අතර බාල සොහොයුරිය නර්තන ගුරුවරියක ලෙස චිත්‍රා අල්ගම නමින් ප්‍රසිද්ධියට පත් වූවාය. සිය පියාවූ පබානිස් ගේ එකම බලාපොරොත්තුව වූයේ පානිස්ට වෙදකම ඉගැන්වීම ය .

එහෙත් පානිස් තම බාප්පා වන අල්ගම කිරිගණිත ගුරුන්නාන්සේගේ නර්තනඅංග දැක වෙදකම් අතහැර නර්තනයට යොමු විය. සිය බාප්පාගෙන් සහ ආත්තාගෙන් උඩරට නර්තනය ප්‍රගුණ කළ පණීභාරතයන් උඩරට බෙර වාදනය ප්‍රගුණ කළේ පුංචි කිරා නම් වූ තම ඥාතියෙකු ගෙනි. එසේම දවුල් වාදනය තම්මැට්ටම් වාදනය මෙන්ම පහතරට, සබරගමු නැටුම් පිළිබඳව ද දක්ෂතා දැක් වූ මෙතුමා ආචාර්ය කලාගුරු ජේ ඩී ඒ පෙරේරා මහතාගේ බිරිය වූ සුප්‍රකට නර්තන ශිල්පිනී චන්ද්‍රලේඛා මහත්මියගේ බෙර වාදකයා ලෙස ද කටයුතු කර ඇත. අත්තනගල්ල රජ මහා විහාරයේදී හිස වෙස් බඳින පණීභාරත මහතා අවුරුදු 15 /16 වන විට දක්ෂ බෙරවාදකයෙක් මෙන්ම නර්තන ශිල්පියකු ලෙස ශිල්පීන් අතර ප්‍රකට විය. 1944 දී ශිෂ්‍යත්වය ක් ලැබ ඉන්දියාවේ ශාන්ති නිකේතනයට ගිය මෙතුමා කථකලි, මණිපුරි යන නර්තන සම්ප්‍රදායන් ද මෘදංගම්, පක්වාජ්, බෝල් වැනි වාදනයන් ද හදාරා ඇත. භාරතයේ දී රබින්ද්‍රනාත් තාගෝර් තුමාගේ ගීත නාටකවල රඟපෑමේ අවස්ථාව ලබා ගත් මෙතුමා එහිදී විශේෂ ප්‍රශංසාවට පාත්‍ර විය. එතැන් පටන් පණීභාරත යන ගෞරව නාමයෙන් මෙතුමා පිදුම් ලැබීය.

## පණීභාරතයන්ගෙන් සිදු වූ සේවාව.

- ගුරුවරයෙකු ලෙස සේවය කිරීම.(කොළඹ රාජකීය විද්‍යාලය/ලොරන්ස් විද්‍යාලය)

- මීරිගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්ය තනතුරෙහි කටයුතු කිරීම.
- රජයේ ලලිත කලායතනයේ විදුහල්පති තනතුර දැරීම.
- කැලණි විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ නර්තන අධ්‍යයන අංශ ප්‍රධාන ලෙස කටයුතු කිරීම.

වසර තිස් එකකට වැඩි කාලයක් කල සේවය අගයනු වස් 1991 දී කැලණි විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ විසින් පණිභාරත මහතා හට ආචාර්ය උපාධියක් පිරිනමන ලදී.

## පණිභාරතයන් විසින් නිර්මාණය කරන ලද නර්තන අංග

- ගොයම් කැපීමේ නැටුම
- මොනර නැටුම
- නාරිලතා නැටුම
- දඬයක්කාරයාගේ නැටුම

## පණිභාරතයන් විසින් නිර්මාණය කරන ලද මුද්‍රානාට්‍ය

- කෝච්චිය
- පොරපොල් පිටිය
- ග්‍රහ අපලය
- ගම්මානේ මල් පිපිලා
- බතේ උපත
- සත් පත්තිනි
- ගමට ඉර පායයි
- මහවැලි

## පණිභාරතයන්ගේ වෙනත් නිර්මාණ

- සිකුරු තරුව /කුරුලු බැද්ද/අශෝකා වැනි චිත්‍රපටිවල නර්තන නිර්මාණ
- කාලගෝල/මහදැන මුත්තා වැනි කලා කෘති

මෙවන් සේවාවක් කරමින් ලෝකයේ බොහෝ රටවල නර්තන ප්‍රසංග දැක්වීම සඳහා සංචාරය කොට ඇති පණිභාරතයන් ශ්‍රී ලංකාවට ලබාදී ඇති කීර්තියත් නර්තන කලාව පිළිබඳව වියත් සමාජයේ අවධානය යොමු නොවී තිබූ වකවානුවක සාම්ප්‍රදායික ගුරු කුලයක ඉපද එකී පරිසරයේ හැදී වැඩී උගත් සමාජයේ ප්‍රභූන් ගේ අවධානය තමා වෙත යොමු කරවා ගනිමින් ශ්‍රී ලාංකේය නර්තන කලා ශිල්පියකු ලෙස අප රටට පමණක් නොව දේශ දේශාන්තරයන්හි තම නාමය පතුරුවා ලන්නට පණිභාරතයන් සමත් විය.



## ගලුකාගම හීන් නිලමේ ගුරුතුමා

- 1914 මාර්තු 14 වන දින රත්නපුර හිදැල්ලන ගලුකාගම කන්දවත්ත නම් වූ සුන්දර ගම්මානයේ උපත ලද වී. හීන් නිලමේ ගලුකාගම හීන් නිලමෙ ගුරුතුමා ලෙස ප්‍රසිද්ධියට පත්විය. සබරගමු නර්තනය කලඑළි කළ ශිල්පීන් පිළිබඳ කරනු ලබන විමසුමකදී ගලුකාගම ගුරු පරපුර අමතක කළ නොහැකිය.

- ඩිංගිරි ගණිතයාගේ පියා වෙතින් ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කළ හීන්නිළමේ ගුරුතුමා සබරගමු නර්තනයට අදාල ගම්මඩු, පහන්මඩු ,කිරි මඩු, හැල්ලුම් මඩු ආදී කොට ඇති මඩු ශාන්තිකර්ම යන්ද සබරගමු යක්තොවිල් සම්ප්‍රදාය සහ බලි ශාන්තිකර්ම සහ ගුප්ත විද්‍යාවන් ද ප්‍රගුණ කළ ශිල්පීයෙක් විය.

එසේ වුවත් හීන් නිලමේ ගුරුතුමා ශාන්තිකර්ම ශිල්පය තම ජීවන වෘත්තිය ලෙස තෝරා නොගත්තේ පියාගෙන් ලත් ආභාසයට අනුව ගොවිතැන ජීවන වෘත්තිය ලෙස තෝරාගෙන දලු ප්‍රවාහනයටත්, දර ප්‍රවාහනයටත් ගොන් කරත්ත භාවිතා කරමින් තත්කාලීනව හොඳ ආදායම් මාර්ගයක් සකස් කර ගත් නිසාවෙනි.

## හීන් නිලමේ ගුරුතුමාගෙන් සිදු වූ සේවාව

- සබරගමු පහන්මඩු යාගය, කිරිමඩු යාගය, නවග්‍රහ බලි ශාන්ති කර්මය, ආදී ශාන්තිකර්ම සඳහා කැපවී කටයුතු කිරීම.
- දේව ස්තෝත්‍ර ගායනයට හා යක්ෂ ස්තෝත්‍ර ගායනයට දක්ෂතා දැක්වීම.
- සබරගමු සන්නි යකුම, ගොපලු සමයම, කුමාර සමයම ,හැන්දෑ සමයම, ආදී ශාන්තකර්ම පැවැත්වීමට උර දී කටයුතු කිරීම.
- තමන් ආයාසයෙන් උගත් ශිල්ප ක්‍රමය සමාජ සත්කාරයක් වශයෙන් භාවිතා කිරීම.
- ගමේ සියලු දෙනාට හදිසි රෝග ආපදාවකදී යක්ෂ භූත දෝස ආදිය නිසා ඇතිවන අතුරු ආන්තරාවක දී නැතිවම බැරි කෙනෙක් බවට පත්වීම.
- යන්ත්‍ර මන්ත්‍ර සෙත් ශාන්ති මගින් බොහෝ රෝගීන් සුවපත් කරවීම. මේ සඳහා කිසිදු මුදලක් අය කර නොගැනීම.
- මෙතුමා විසින් සබරගමු නර්තනය උගන්වා විශාල ගෝල බාලයන් පිරිසක් ක්ෂේත්‍රයට හඳුන්වාදීම. මේ අතරට ඔහුගේ දරුවන් මෙන්ම මුණුබුරන්ට ඇතුළත් විය. මේ නිසා ගලුකාගම ගුරු පරපුරෙහි නිර්මාතෘවරයා ලෙස හීන් නිලමේ ගුරුතුමා ප්‍රසිද්ධියට පත්විය.
- හීන් නිලමේ ඇදුරුතුමාගේ වැඩිමහලු පුත්‍රයා වන ජනාධිපති සම්මානලාභී ඩී.වී. පුංචිනිලමේ අති දක්ෂ නර්තන හා වාදන ශිල්පියෙකු වූ අතර රාම් ගාඩින්ස් සහ ඉලකැය පත්තිනි දේවාලයේ ප්‍රධාන කපු මහත්තයා වශයෙන්ද රත්නපුර මහ සමන් දේවාලයේ රාජකාරි නර්තන කාර්යෙහි ප්‍රධානියා බවට ද පත්විය.
- සබරගමු මහ සමන් දේවාලයේ නැටුම් කණ්ඩායම් භාරව කටයුතු කළ හීන් නිලමේ ගුරුතුමා දේවාභරණ වැඩමවන අවස්ථාවේ දී මංගල දවුල් වාදනය කිරීම සඳහා වසර ගණනාවක්ම කටයුතු කළේය.

ගොවිතැනින් උපයාගත් අස්වැන්නෙන් සමෘද්ධිමත් පවුලක උපන් හීන් නිලමේ ගුරුතුමා ගලුකාගම පරපුර නමින් නව නර්තන පරපුරක් බිහිකිරීමට පුරෝගාමී වූ අතර 1990 අගෝස්තු මස 17 වන දින අප අතරින් සමු ගත්තේ සබරගමු නර්තන සම්ප්‍රදාය වෙනුවෙන් සුවිසල් මෙහෙවරක් ඉටු කරමිනි

## කේ. එස්. ප්‍රනාන්දු ගුරුතුමා



- ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ලොකන් වත්තේ උපත ලද කරුනච්චාරි සුදෙරිස් ප්‍රනාන්දු හෙවත් කේ. එස්. ප්‍රනාන්දු මහතා 1920 පෙබරවාරි විසි වන දින උපත ලැබීය. කීර්තිමත් පහතරට නර්තන ශිල්පියෙකු වූ මීගම සරනෙරිස් ගුරුතුමා කේ. එස් ප්‍රනාන්දු මහතාගේ පියා ය.ශාන්තිකර්ම රංග භූමියේ මීගම රත්තා ලෙසත් කලා ක්ෂේත්‍රයේ බොහෝ දෙනා හඳුනාගෙන සිටී.

- මෙතුමා ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමට අත් පොත් තැබුවේ මාතර ඤාණාරාම පණ්ඩිත ස්වාමීන් වහන්සේ වෙතිනි. පසුව තත්කාලීන බෙන්තර සම්ප්‍රදාය තුළ දක්ෂතම නර්තන ශිල්පියා ලෙසත් ශාස්තෘවරයා ලෙසත් ප්‍රකට ව සිටි සුද්ද ගොඩ අමරස ගුරුතුමා වෙතට නර්තනය ඉගෙනීම සඳහා පියා විසින් භාර කරන ලද්දේ වයස අවුරුදු 13 දී ය.
- ශාන්තිකර්ම ක්ෂේත්‍ර යට අදාළ ශිල්ප ධර්ම පාරම්පරිකව තම පියාගෙනුත් නර්තනයට අදාල පද, සුරල් , ඉරට්ටි සියල්ල ගුරුතුමාගෙනුත් ඉගෙනීමට මෙතුමා වාසනාවන්ත විය.අමරස ගුරුතුමා වෙතින් නර්තනය පමණක් නොව බලි ඇඹීම,බලි චිත්‍රණය, ගොප්කොල කැටයම් කලාව, වෙස්මුහුණු නිර්මාණය, රංග වස්ත්‍ර නිර්මාණය ආදී කලාවන් ද ප්‍රගුණ කළේය.

### කේ එස් ප්‍රනාන්දු ගුරුතුමා කළ සේවාව

- පහතරට නර්තන ආචාර්යවරයකු ලෙස රජයේ සේවයට එක්වීම.
- රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ උපදේශකයෙකු ලෙස දිගු කලක් සේවය කිරීම.
- පහතරට නර්තන සම්ප්‍රධාය විශ්වවිද්‍යාල මට්ටමට ගෙන ඒමට කටයුතු කිරීම.
- ශාන්තිකර්ම වලට සීමා වී තිබූ පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රාසාංගික තත්වයට ගෙන ඒමටත් පාසල් පද්ධතියට සුදුසු වන පරිදි නර්තනාංග සැකසීමටත් කටයුතු කිරීම.
- යක් තොවිල් පිළිබඳව මෙන්ම බලියාග පිළිබඳවද හසල දැනුමක් ලබා සිටි මෙතුමා බෙන්තර ශෛලියේ ප්‍රධාන යම් තොවිලයක් වන සන්නි යකුම පිළිබඳ කෘතිය සම්පාදනය කිරීම.( සන්නි යකුම හෙවත් දහඅට සන්නිය)
- නාට්‍ය සඳහා රංගන ක්‍රම සකස් කිරීම

  ¶ ජනවේගය ¶ මල කෝලම්

  ¶ මාහේනේ රීරි යකා ¶ මිණි සළඹ
- නිර්මාණ ප්‍රසංග ඉදිරිපත් කිරීම.

  ¶ හෙළ රසාංග
- රංග වස්ත්‍රාභරණ නිර්මාණය කිරීම.
- නර්තනාංග නිර්මාණය කිරීම.

¶ ගිරිදේවි නැටුම ¶ සළුපාලිය

¶ රති රාග වන්නම ¶ සුරඹාවල්ලිය

¶ නාරිලතා කෝලම

- අද්‍යතනය ජනප්‍රිය ගැමි නැටුමක් ලෙස සලකන කුලු නැටුම ප්‍ර සංග වේදිකාවට නිර්මාණය කිරීම.
- චිත්‍රපට සඳහා නර්තන නිර්මාණ කිරීම ¶ සුදු පරවියෝ ¶ දෛවයෝගය

පණිභාරත චිත්‍රසේන නිත්තවෙල ගුණයා න ප්‍රවීනයන් සමග ඉතාලිය ප්‍රංශය ඕලන්දය එංගලන්තය කැනඩාව ඇමෙරිකාව වැනි රටවල සංචාරය කරමින් එයින් ලද දැනුම උපයෝගී කරගෙන කරගෙන පහතරට නර්තනයට ව ප්‍රබෝධයක් එක්කල කේස් ප්‍රනාන්දු ගුරුතුමා 1999 මාර්තු මස 6 වන දින අප අතරින් සමුගත්තේය.

<u>කාර්ය පත්‍රිකාව</u>

1. පණිභාරත ගුරුතුමාගේ මුල්නම වන්නේ.
   1 කිරි ගණිත 2 පබානිස් 3 පානිස් 4 පුංචි කිරා
2. පණිභාරත මහතා විසින් වේදිකා ගත කළ නැටුමකි.
   1 කුළු 2 ගොයම් 3 මෝල්ගස් 4 පතුරු
3. සන්නි යකුම හෙවත් දහඅට සන්නිය කෘතිය රචනා කරන ලද්දේ.
   1 ගෝමිස් ගුරුතුමා 2 කේ.එස්.ප්‍රනාන්දු 3 සරිවිස් සිල්වා 4 විල්සන් ඕලබොඩුව
4. හීන් නිලමේ ගුරුතුමාගේ ජීවන වෘත්තිය වූයේ
   1 ගොවිතැන 2 වෙදකම 3 නර්තනය 4 දවුල් වාදනය
5. කුළු නැටුම වේදිකාවට හඳුන්වාදීමේ ගෞරවය හිමිවන්නේ.
   1 එස්. පණිභාරත 2 ඩී.වී. හීන්නිලමේ 3 කේ.එස්. ප්‍රනාන්දු 4 විල්සන් ඕලබොඩුව

➢ යා කරන්න.

| | |
|---|---|
| 1. පණිභාරත ගුරුතුමා | 1. කේ.එස්. ප්‍රනාන්දු |
| 2. ගම්මානේ මල්පිපිලා | 2. සබරගමු සම්ප්‍රදාය |
| 3. දහඅට සන්නිය කෘතිය | 3. චිත්‍ර පට |
| 4. හීන් නිලමේ | 4. පානිස් |
| 5. සිකුරු තරුව | 5. මුද්‍රා නාට්‍ය |

➢ පිළිතුරු ලියන්න

1. ඉහත නර්තන ශිල්පීන් තිදෙනා දායකත්වය දැක්වූ නර්තන සම්ප්‍රදායන් තුන දක්වන්න
2. පණිභාර්තයන් විසින් නිර්මාණය කරන ලද මුද්‍රානාට්‍ය මොනවාද?
3. හීන් නිලමේ ගුරුතුමා දක්ෂතා දැක්වූ ශාන්ති කර්ම මොනවාද?
4. කේ.එස් ප්‍රනාන්දු ගුරුතුමා විසින් නිර්මාණය කරන ලද නර්තන අංග කිහිපයක් නම් කරන්න.
5. මෙම නර්තන ශිල්පීන් තිදෙනා කළ සේවාවන් 2ක බැගින් ලියන්න.
6. චන්ද්‍රලේඛා මහත්මිය බෙර වාදකයා ලෙස කටයුතු කලේ කවුද?

නර්තනය

8 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.ජී. චින්තා පෙරේරා අම්/ සද්ධාතිස්ස මහා විද්‍යාලය

නිපුණතාව : 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි.
නිපුණතා මට්ටම : 6.1 පෙරහැර හා සබැඳි පසුබිම අධ්‍යනය කරමින් සුවිශේෂී ලක්ෂණ විචාරය කරයි.

## දළදා පෙරහැර



බෞද්ධාගමික ජනයාගේ මුදුන් මල්කඩ ලෙස පිළිගැනෙන දළදා වහන්සේ සකල ලෝකවාසී ජනතාවගේ වන්දනා මානයට පාත්‍ර වූ අති පූජනීය වස්තුවකි.
අතීතයේ රජ දරුවන්ගේ රාජ්‍ය උරුමයේ ප්‍රධාන සංකේතය වී ඇත්තේ දළදා වහන්සේය. ඒ නිසා ඔහුගේ පරසතුරු මාධ්‍යය් වුවද තම පණ මෙන් දළදා වහන්සේ ආරක්ෂා කළහ.

### දළදා පෙරහැර මුල් වරට පවත්වන ලද්දේ

- හතරවන සියවසේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ කාලයේ දී බව පිලිගැනේ. රජු දළදා වහන්සේ රාජකීය මන්දිරයේ සිට අභයගිරි විහාරයට පෙරහැරෙන් වැඩම කොට ඇති අතර මග දෙපස බෝධි සත්ත්ව ප්‍රතිමා සකස් කර තැබූ බවත් ජාතක කථා ප්‍රදර්ශනය කළ බවත් සඳහන් වේ.



දළදා මාලිගාව

කීර්ති ශ්‍රී මේඝවර්ණ රජ





අභයගිරි විහාරය

- පොළොන්නරු යුගයේ රජකළ මහා පරාක්‍රම බාහු රජු අති උත්කර්ෂවත් අන්දමින් දළදා පෙරහැර පවත්වා ඇත.
- දඹදෙණි යුගයේ රජකල දෙවන පරාක්‍රම බාහු රජු නැටුම්, ගැටුම්, වැයුම් මැද දළදා පෙරහැරේ ගමන් කර ඇත.
- විවිධ ආක්‍රමණ හා සතුරු උවදුරු නිසා කෝට්ටේ යුගයේ හා මහනුවර යුගයේ මුල් කාලයේ දළදා පෙරහැර නොපවත්වන ලදී.

### දළදා පෙරහැර පවත්වන කාල සීමාව

- දළදා මාළිගාව හා සතර දේවාලයේ පෙරහැර ඇසළ මාසයේ පවත්වන හෙයින් ඇසළ මහ පෙරහැර නමින් හැඳින්වේ.

### දළදා පෙරහැර පවත්වන අරමුණු

- මෙකී පෙරහැර දළදා වහන්සේට උපහාර පිණිස,
- රටට සෞභාග්‍ය උදාකර ගැනීම
- කලට වැසි ලබා ගැනීම අරමුණු කොට ගෙන පවත්වනු ලැබේ.

දේශීය අනන්‍යතාව පිළිබිඹුවන විවිධ සංස්කෘතික කලාංග ඇතුළත්ව ඉතාම චමත්කාර ජනකව දින ගණනක් වීදි සංචාරය කරන දළදා පෙරහැර, දේශයේ ප්‍රෞඩත්වය, අභිමානය පෙන්නුම් කරන ජාතික උත්සවයක් ලෙස වර්තමානයේ පිළිගැනේ.

<u>දළදා පෙරහැරේ චාරිත්‍ර</u>

- නැකැත් සෑදීම
  දළදා මාළිගාව හා සම්බන්ධ නැකැත්කරු විසින් සුබ නැකැත් සකස් කිරීම.
- කප් සිටුවීම
  පෙරහැර පවත්වන බවට භාර භාර වීම.





- කුඹල් පෙරහැර
  සතර දේවාලය මඟින් පවත්වනු ලබන නැටුම්, ගැයුම්, වැයුම් සහිතව දින 5ක් පුරා පැවැත්වෙන අලංකාර පෙරහැරකි.
- රන්දෝලි පෙරහැර
  කුඹල් පෙරහැර අවසානයේ දී දළදා පෙරහැර සමඟ එක් වී රන්දෝලි පෙරහැර නමින් දින 5 ක් වීදි සංචාරය කරයි. මෙය එන්දෝලි පෙරහැර නමින් හඳුන්වනු ලබන්නේ සතර දේවාල වලට අයත් දෝලාවන් රැගෙන යන හෙයිනි.



  රන්දොල් පෙරහැර පවත්වන දිනයන් හී මාළිගාවේ ප්‍රධාන දොරටුව අභියස දී කරඬුව ගෙනයන හස්තියා සැරසීම සිදුකර පංචතූර්ය නාදය මැද්දේ දළදා කරඬුව ඇතා පිට තබනු ලබයි.
  අනතුරුව වෙඩිමුර තැබීමෙන් පෙරහැර ආරම්භ කළ බව සන්නිවේදනය කෙරෙයි. ඉන්පසු ගමන් හේවිසි පද වාදනය මධ්‍යයේ පෙරහැර ගමන් කරයි.
  රන්දෝලි පෙරහැර පැවැත්වීමේ දී සාම්ප්‍රදායානුකූල ක්‍රමයක් පවතී.
- දිය කැපීම



  රන්දෝලි පෙරහැර අවසන් දිනයේ මාළිගාවට කලින් දින වල මෙන් ගෙවදින්නේ නැත.
  එදින පාන්දර පෙරහැර ආදාහන මළුව වෙත ගමන් කර දළදා කරඬුව ගෙඩිගේ විහාරයේ තැන්පත් කරනු ලබයි. අනතුරුව දේවාල පෙරහැර ගැටඹේ තොටට ගොස් දිය කැපීම සිදුකරනු ලැබේ.
  එදින දහවල් පෙරහැරකින් නැවත දළදා මාළිගාව වෙත ගමන් කොට මාළිගය වටා තුන්වරක් පැදකුණු කිරීමෙන් පසු ව පෙරහැර අවසන් කෙරෙයි.

**පෙරහැර නිමා කළ පසු එය රජුට දැනුම් දීම අතීතයේ සිට පැවත එන චාරිත්‍රයකි. එය සංකේතවත් කරමින් වර්තමාන දියවඩන නිලමේ හා සතර දේවාල වල බස්නායක නිලමේවරු මහනුවර ජනාධිපති මන්දිරයට ගොස් ජනාදිපතිතුමාට පෙරහැර සාර්ථකව නිමා කළ බව පවසයි.**

**පෙරහැරට සහභාගී වූ සියලුම දෙනාගේ වස්දොස් දුරුවීම සඳහා විෂ්ණු දේවාලයය මුල්කරගෙන දින 7 ක් වලියක් මංගල්‍යය පවත්වනු ලබයි.**

දළදා පෙරහැරේ අනුපිළිවෙලින්

- කසකරුවෝ
- ගිනිබෝල්කරුවෝ
- කොඩි ගෙනයන්නෝ
- පෙරමුනේ රාළ
- හේවිසි වාදකයෝ
  (දවුල්, තම්මැට්ටම්, හොරණෑ, තාලම්පට)
- ගජනායක නිලමේ (පෙරහැරේ අලි ඇතුන් භාරව සිටින්නේ මොහුය)
- ඇත්තු, නැට්ටුවෝ හා බෙර වාදකයෝ
- කාරිය කෝරාල
- කව්කාර මඩුවේ ශිල්පීන්
- වෙස් නැටුම් කණ්ඩායම
- දළදා කරඬුව රැගත් හස්තියා
- වෙස් නැටුම් කන්ඩායම හා බෙර වාදකයෝ
- දියවඩන නිලමේ
- සතර දේවාලය පෙරහැර පෙරහැරේ කාන්තා නියෝජනයක් දක්නට ලැබෙන්නේ පත්තිනි දේවාලය පෙරහැරේ පමණි.

මහනුවර දළදා පෙරහැර උඩරට සම්ප්‍රදාය හා ගැමි නර්තන අංගයන්ගෙන් පමණක් පෝෂණය වී ඇත.
ඉතා දක්ෂ ගායන, වාදන, නර්තන ශිල්පීහු සහභාගී කරවා ගැනෙති. සෑම විටම දලදා කරඬුව ඉදිරියෙන් හා දියවඩන නිලමේ ඉදිරිපස මෙම නැටුම් කන්ඩායමක් නර්තනයේ යෙදෙති.

## නර්තන අංග

- වෙස් නර්තනය
- උඩැක්කි, පන්තේරු (උඩරට සාම්ප්‍රදායික නර්තන අංග)





- රබන්, වේවැල් පතුරු, ලී කෙළි, චාමර, සවරං, කඩු, තාලම් (ගැමි නැටුම්)
- සතර දේවාලය පෙරහැර අතර කතරගම දේවාලය පෙරහැර සඳහා සුවිශේෂ වූ නර්තන අංග දක්නට ඇත.

## වාදන අංග

- තම්මැට්ටම්, දවුල්, හොරණෑ වාදකයෝ ඔවුන්ගේ දක්ෂතා විදහා දක්වමින් පෙරහැරේ ගමන් කරති.

## ගායනා

- උඩැක්කි කවි
- පන්තේරු කවි
- වරම් කවි හා ගැමි නැටුම් ආදියට අදාළ කවි ගායනා

## පෙරහැර අලංකාර කිරීම සඳහා

- කස පුපුරන්නෝ
- ගිණිබෝල කරුවෝ
- කොප්පරා, පන්දම්කරුවෝ
- සේසත්, චාමර, කොඩි, මුරායුධ රැගෙන යන්නෝ
- අලි ඇතුන් යොදා ගැනෙති.





අලි ඇතුන් සරසනු ලබන්නේ විවිධ වර්ණයෙන් යුත් වස්ත්‍ර වලිනි. එම වස්ත්‍ර සාම්ප්‍රදායික සැරසිලි වලින්හා මෝස්තර වලින් යුක්තව සකස්කර තිබේ. අලි ඇතුන් විදුලි බුබුළු යෝදා ආලෝකමත් කර අලංකාර කරයි. රන්සිවිගෙය සුදු වර්ණයෙන් යුත් මල් මාලාවන්ගෙන් අලංකාර කර ඇති අතර කරඬුව රැගෙනයන හස්ති රාජයා මහත් වූ ගාම්භීර බවක් දිස්වෙන අයුරින් සැරසීම විශේෂත්වයකි.



**රන්සිවිගෙය**



**කරඬුව රැගෙනයන හස්ති රාජයා**



- වෙස් ඇඳුම් කට්ටලය
- නෛයිඅඩි ඇඳුම් කට්ටලය
- උඩැක්කි
- පන්තේරු ඇඳුම් කට්ටලය

**ගැමි නැටුම් සඳහා වූ රංග වස්ත්‍රාභරණ යොදා ගැනේ.**

මහනුවර දළදා පෙරහැර සඳහා ස්ථිර වශයෙන් ම නර්තන, ගායන, වාදන ශිල්පීහු සිටිති.

ඔවුහු පෙරහැර වෙනුවෙන් සේවය කිරීම භාග්‍යයක් කොට සලකති. අතීතයේ රජදරුවන් මොවුන් හට

ගම්වර ලබා දී ඇත.

වර්තමානයේ දී විවිධ දක්ෂකම් දැක්වූවන් හට සම්මාන ලබා දී ප්‍රශංසා කර ඔවුන් දිරිමත් කිරීම සිදු කෙරේ.

## කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. දළදා පෙරහැර මුල්වරට පවත්වන ලද්දේ,

1. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කළ 2. බුවනෙක බාහු රජු කළ
2. කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු කළ 4. භාතිකාභය රජු කළ

02. ඇසළ පෙරහැර පවත්වනු ලබන මාසය වන්නේ,

1. අගෝස්තු 2. ජුනි 3. සැප්තැම්බර් 4. ජූලි

03. පෙරහැරට සහභාගී වූ සියලු දෙනාගේ වස්දොස් දුරුවීම සඳහා පවත්වන ශාන්ති කර්මය වන්නේ,

1. වලියක් මංගල්‍යය 2. සූනියම් යාගය 3. රට යකුම 4. නානුමුර මංගල්‍යය

04. දළදා පෙරහැරේ දැකිය හැකි ප්‍රධානම නර්තන අංග

1. පහතරට නැටුම් 2. සබරගමු නැටුම් 3. උඩරට වෙස් නැටුම් 4. ද්‍රවිඩ නැටුම්

05. පෙරහැරේ මුලින්ම ගමන් කරනු ලබන්නේ,

1. ගිනි බෝල කරුවන් 2. කස කරුවන් 3. පෙරමුනේ රාළ 4. හේවිසි වාදකයෝ

➢ පහත වගන්ති හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.

09. වලියක් මංගල්‍යය පවත්වනු ලබන්නේ විෂ්ණු දේවාලය මුල් කරගෙන ය. ( )

10. දළදා පෙරහැරේ මුල්ම චාරිත්‍ර අංගය වන්නේ කප් සිටුවීමයි. ( )

11. සතර දේවාලය මඟින් පවත්වනු ලබන පෙරහැර කුඹල් පෙරහැර නම් වේ. ( )

12. පෙරහැරේ කාන්තා නියෝජනයක් දක්නට ලැබෙන්නේ විෂ්ණු දේවාලයේ ය. ( )

13. දිය කැපීම සිදු කරනු ලබන්නේ ගැටඹේ තොටේ දීය. ( )

➢ කෙටි පිළිතුරු සපයන්න.

06. දළදා පෙරහැර හා සබැඳි ඓතිහාසික පසුබිම කෙටියෙන් පහදන්න.

07. දළදා පෙරහැර පැවැත් වීමේ අරමුණු 03 ක් ලියා දක්වන්න.

08. දළදා පෙරහැරේ දැකිය හැකි චාරිත්‍ර විධි 05 ක් ලියා දක්වන්න.

09. ඇසළ පෙරහැරේ දැකිය හැකි නර්තන අංග 05 ක් ලියා දක්වන්න.

10. මහනුවර ඇසළ පෙරහැර මැයෙන් බිත්ති පුවත් පතකට ලිපියක් සකස් කරන්න.

| නර්තනය | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය. | 111 - වාරය | |
| ගුරුභවතාගේ නම : H.M. නදීකා ශිරෝමි | | අම්/සේනාගම මහ විද්‍යාලය |

නිපුණතාව : 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතා මට්ටම : 6.2 වෙනත් සංස්කෘතීන්වලට අයත් නර්තන අංගවල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි.

## <u>භරත නාට්‍යම් සම්ප්‍රදාය</u>

ශ්‍රී ලංකාව ද ඈත අතීතයේ සිටම භාරතය සමග සමීප සබඳතාවන් පවත්වා ඇත. එසේ හෙයින් ඉන්දියානු සම්භවයක් සහිත එකී සංස්කෘතියෙන් පෝෂණය වූ ජන කොටස් උතුරු නැගෙනහිර පළාත් වල බහුල වශයෙන් ද, අනෙකුත් ප්‍රදේශවල නගරාසන්නව ද, වතුකරයේ ද ජීවත් වෙති. ශ්‍රී ලාංකේය ප්‍රජාවෙහි එක් ජන කොටසක් ලෙස සලකන මෙකී ප්‍රජාව ද්‍රවිඩයන් ලෙස හඳුන්වන අතර , ඔවුන් සතු නර්තන ක්‍රමය “භරත නාට්‍යම්” ලෙස හඳුන්වති.

මෙකී නර්තන ක්‍රමය අද්‍යතන වන විට ද්‍රවිඩ ප්‍රජාව අතර පමණක් නොව සිංහල ප්‍රජාව අතරද ව්‍යාප්ත වී ඇත. එසේ හෙයින් “භරත නාට්‍යම්” නමින් හඳුන්වනු ලබන නර්තන ක්‍රමය පිළිබඳව තොරතුරු විමසා බැලීම මෙම පාඩමෙන් අරමුණු කෙරේ.

### <u>ප්‍රචලිත ප්‍රදේශ</u>

- නිජබිම :- දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තය
- ආන්ද්‍රා , කේරළ , කර්ණාටක , මහාරාෂ්ට , මදුරාසිය

### <u>ආගමික සබඳතා</u>

- මෙය දකුණු ඉන්දියානු හින්දු දේවාලයන්හි දෙවියන් ඉදිරියෙහි නර්තනය කිරීම සඳහා යොදා ගන්නා ලද්දකි. එකී දෙවියන්ට පූජා පිණිස දේවාලවල සේවය කළ “දේවදාසී” නම් ස්ත්‍රීන් විසින් මෙම නර්තන ක්‍රමය රඟ දක්වන ලද නිසා “දාසි ආට්ටම්” නමින්ද හඳුන්වා ඇත.

### <u>ඓතිහාසික පසුබිම</u>

- භරත මුණිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව රඟ දක්වන නිසා මෙය භරත නැටුම වේ.
- භාව රාග තාල යනුවෙන් මෙකී අන්තර් ගතය ගොඩ නැගී ඇති නිසා එම වචන තුනෙහි මුල් අක්ෂර තුන එකතු වීමෙන් භරත වූ බව.

### <u>සංගීතය හා වාදන භාණ්ඩ</u>

- දක්ෂින භාරතීය කර්ණාටක සංගීතය



මෘදංගය



නටුවාංගම්



වීනාව



වයලීනය



බටනලාව

- නටුවාංගම් වාදනය කරනු ලබන්නේ නටුවනාර්(ගුරුවරයා) විසිනි.

<u>අධ්‍යාපන ආයතන</u>

- අඩියාර් හි කලා ක්ෂේත්‍ර
- මෙහි ආරම්භකයා වූයේ රුක්මණී දේවී අරුන්ඩේල් ශිල්පිණියයි.

නර්තන අංග

- අලාරිප්පු
- ජතිස්වරම්
- ශබ්දම්
- වර්ණම්
- පදම්
- තිල්ලානා
- ශ්ලෝකම්

රංග වස්ත්‍රාභරණ







කාන්තා රංග වස්ත්‍රාභරණ කට්ටලය ආකාර තුනකින් යුක්ත වේ.

සාරි උඩෙයි | පිජාමා උඩෙයි | පාවාඩ දාවනී උඩෙයි







## අංග රචනය

- උප්පනෙයි යනුවෙන් හැඳින්වේ.

අංග රචනය

- සරල ස්වාභාවික අංග රචනයක් යොදා ගනී. මුහුණ පැහැපත් කරන වර්ණාලේප ගල්වා ඇහි බැම සරසා නළලේ තිලකලයි. පුරුෂයින් නළලේහි සුදු පැහැති ඉරි යොදා ඇහි බැම ඇඳ , ඇහි බැම දෙකට මැදින් නළලෙහි තිලකලති.

## නර්තනයට දායක වූ අය

- තාන්ජාවූර් සහෝදරයෝ
- මීනාක්ෂි සුන්දරම්පිල්ලෙයි
- බාලා සරස්වතී
- රුක්මනි දේවී අරුන්ඩේල්
- අම්ලා දේවී
- ශ්‍රීමතී ශාන්තා



චින්නයියා , පොන්නයියා , ශිවනාදන් , වඩිවේළු) මීනාක්ෂි සුන්දරම්පිල්ලෙයි



රුක්මණී දේවි අරුන්ඩේල්



බාලා සරස්වතී

## අරංගේත්‍රම් සංදර්ශනය

උඩරට නර්තන සම්ප්‍රදායේ නැටුම් ශිල්පය හදාරා හිසවෙස් බඳින මංගල්‍යය කලඑළි මංගල්‍යය වේ. එසේම භරත නිළියකගේ එම අවස්ථාව අරංගේත්‍රම් නම් වේ. එදින වේදිකාව මත ශිව දෙවියන් වඩා හිඳුවා නියමිත වතාවත් කරයි. එතෙක් නවක නිළිය වැදගෙන හිඳී. පූසාරි විසින් දෙන ළඳ පහන් වැටි අත ගා ඒවාට වැඳීමෙන් අනතුරුව ගුරුවරයා අතින් නැකතට ගෙජ්ජි පොකුර ලබා ගනී. පසුව දෙමාපියන්ට ගෙජ්ජි පොකුර දී වැඳීමෙන් අනතුරුව එය තමා විසින් බැඳ ගනී. ගුරුවරයා අතින් විශේෂයෙන් සිදුවනුයේ නවක නිළියකගේ නළලේ තිලකය තැබීමයි. ඉන් පසු ගුරුවරයාට වැඳ ඇගේ සංදර්ශනය කරයි.

## කාර්ය පත්‍රිකාව

1. භරත නාට්‍යම් සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස,

    1. තමිල්නාඩුව, තාන්ජෝරය, ඩෙකැන්, මදුරාසිය,
    2. තාන්ජෝරය, ඩෙකැන්, මදුරාසිය,දිල්ලිය
    3. මදුරාසිය, දිල්ලිය, කල්කටා, චෙන්නයි
    4. ලක්නව්, ජායිපූර්, බෙනාරිස්, දිල්ලි

2."භරත යනු ".........

    1. භාරතයේ නිර්මාණය වීම යන්නයි.
    2. භාව රාග තාල යන්න එකතු වීමෙන් නිර්මාණය වීම
    3. භගවත් ගීතාවෙන් නිර්මාණය වීමයි
    4. දකුණු ඉන්දියාවේ නිර්මාණය වීමයි

3.භරත නාට්‍යම් ලෙස හඳුන්වන්නේ,..........

    1. කර්ණාටක සංගීතය ඇතුලත් නිසා
    2. දකුණු ඉන්දියාවේ ප්‍රචලිත නිසා
    3. ක්‍රිෂ්ණ දෙවියන්ගේ කතා පුවත් ඇතුලත් නිසා
    4. භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ එන නෘත නෘත්‍ය නාට්‍ය අංග නිසා

4. අතීතයේ දී දෙවියන් පිනවීම සඳහා දේවාල වල නර්තන කළ කාන්තාවන් හැඳින්වූයේ,

1. නිළියන් ලෙස　　2. අංගනාවන් ලෙස
3. දේවදාසීන් ලෙස　　4. ආලත්ති අම්මාවරු ලෙස

5. භරත නාට්‍යම් හි සංගීත සම්ප්‍රදාය වනුයේ ,

1. දක්ෂිණ භාරතීය කර්නාටක සංගීත　　2. උත්තර භාරතීය හින්දුස්ථානි සංගීතය
3. දක්ෂිණ භාරතීය හින්දුස්ථානි සගීතය　　4. උත්තර භාරතීය බටහිර සංගීතය

6. භරත නාට්‍යම් හි ගැයුම්, වැයුම් යන අංගයන් හි දැනුම ඇති ගුරුවරයා හඳුන්වන නාමය වනුයේ,

1. ශිංකිඩි　　2. පොන්නානි　　3. කදුකාරම්　　4. නට්ටුවනාර්

7. භරත නාට්‍යම් සංදර්ශනයක් වර්තමානයේ තිබෙන තත්වයට සංවර්ධනය කිරීමේ ගෞරවය.

1. තාන්ජාවූර් සොහොයුරන්ට　　2. මීනක්ෂි සුන්දරම් පිල්ලෙට

3. වල්ලතෝල් නාරයන් මෙනන්ට　　4. රබීන්ද්‍රනාත් තාගෝර් තුමාට

8. භරත නාට්‍යම් සම්ප්‍රදාය උගන්වන ආයතනයකි.

1. අඩියාර් හි කලා ක්ෂේත්‍රම්　　2. ශාන්ති නිකේතනය

3. භාත්ඛණ්ඩ විශ්ව විද්‍යාලය　　3. කේරළ කලා මණ්ඩලම්

9. භරත නට්‍යම් සම්ප්‍රදායේ ...................................... එහි ප්‍රධාන අවනද්ධ භාණ්ඩයයි.

10. භරත නාට්‍යම් හි සංගීතඥයා ............................. ලෙස හැඳින්වේ.

11. සතර අභිනය වඩාත් පොහොසත් නර්තන සම්ප්‍රදාය ලෙස භරත නාට්‍යම් සම්ප්‍රදාය හැඳින්විය හැක.උදාහරණ සහිතව පහදන්න.

12. භරත නාට්‍යම් සම්ප්‍රදාය ඇතිවීමේ ලා බලපෑ ආගමික පසුබිම විස්තර කරන්න.

13. භරත නාට්‍යම් සංදර්ශනයක නර්තන අංග පිළිවෙලින් නම් කර ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

14. භරත නාට්‍යම් සංදර්ශනයක නර්තන අංග අනුපිළිවෙලට සකස් කළ තාන්ජාවූර් සහොයුරන් නම් කර ඔවුන් පිළිබඳ ඇගයීමක් කරන්න.

15. භරත නාට්‍යම් සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම් කර ඒ පිළිබඳ විස්තරයක් කරන්න.

නර්තනය

8 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : ඩී. ඩී.එස්.පුෂ්පලතා. අම්/ බණ්ඩාරනායක බා. ජා.පා.

නිපුණතාව : 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලාංග නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම : 7.1, 7.2 නිර්දේශිත ගීතයට සවන් දී සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි.

## <u>නර්තන නිර්මාණ සඳහා උචිත නිර්දේශිත ගීත හඳුනා ගනිමු</u>

ගීත අනුව නර්තන නිර්මාණය කිරීම අද්‍යතන ප්‍රසංග කලාවන් හි බහුලව දක්නට ලැබෙන්නකි. එබැවින් එම ගීතවල තාල , නාද රටාව අවබෝධ කරගෙන ගීත ගායනය කිරීම හා නර්තන ඉදිරිපත් කිරීම සිදු කරයි.

### <u>දීකිරි දීකිරි</u>

දීකිරි දීකිරි ගෙනාව දීකිරි
මිහිපිට කාටත් ගුණ දෙන දීකිරි...//

පැටියා මෝරපු දෙණ ගෙන් ගත් කිරි
හොඳ හැටි උණු කොට හින්දාගත් කිරි
නැවුම් මුට්ටියේ වත්කල මේ කිරි
පණමට ලාබයි මං දෙන මේ කිරි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....

කිරි විකුණාලා කාසි හොයන්නයි
අනාගතේ මාළිගා තනන්නයි
කුමාරයෙක් ගෙදරට කැන්දන්නයි
මුට්ටිය බිඳුනොත් ඔක්කොම ඉවරයි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....

හිස මගේ දෙදරයි දෙපා රුදා දෙයි
රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පණමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි
මගේ මංගල්ලෙට ඔහෙලත් එන්නයි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි..../ / /

ගායනය : අනුලා බුලත්සිංහල

ගී පද රචනය - ලූෂන් බුලත්සිංහල

සංගීතය. - ඔස්ටන් මුණසිංහ

ගායනය. - අනුලා බුලත්සිංහල



- මෙම ගීතය ඇතුළත් වී ඇත්තේ ලූෂන් බුලත්සිංහල ශූරීන් විසින් අධ්‍යක්ෂණය කරන ලද රතු හැට්ටකාරී නාට්‍යයේ ය. මෙය ගැමි ජනතාවගේ ජීවන වෘත්තිය තේමා කරගත් ගීතයකි.

## <u>රත්නදීප ජන්ම භූමි</u>.....

(රත්නදීප ජන්ම භූමි ලංකාදීප විජය භූමි)//
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි

ආදි සිංහලේ වීර මීමුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි

(මානික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී) // ඇත්තෙ ඒ අභීත දූ පුතුන්
(ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ)// ජීවිතේ පුදා හෙලූ ලේ කඳයි

(සින්දූපමාන වැව් තලා මතින් ඇදී)// පද්ම රේණුයෙන් සුගන්ධ වී
(රන් කරල් නමා හමා සිත් ප්‍රබෝධයෙන් පුරා)//
එන්නෙ උන් හෙලූ ප්‍රාණ වායුවයි

(ගංගා තරංග රාව දී රිදී වනින්)// මල් පිපී කුළෙන් කුළේ හැපී
(ගායනා කරන්නේ ආකාසයේ නැගී)// වීරයින්ගෙ ඒ යශෝ ගීතයයි

(රත්නදීප ජන්ම භූමි ලංකාදීප විජය භූමි)//
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි
ආදි සිංහලේ වීර මීමුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි

ගී පද රචනය : මහගම සේකර
සංගීත රටා : පණ්ඩිත් අමරදේව
ගායනය : පණ්ඩිත් අමරදේව



- සිංහල ජනතාවගේ උදාරතර මාතෘ භූමිය වූ ශ්‍රී ලංකාද්වීපයේ ස්වභාව සෞන්දර්ය වර්ණනා කරමින් එය ආරක්ෂා කර ගැනීමට කැපවූ සිංහල වීරයන් සිහිපත් කිරීම තේමාකොට ගත් දේශාභිමාන ගීතයකි.
- දූවේ පුතේ මෙම ගීත දෙකම අන්තර්ජාලය ආධාර කරගෙන හොඳින් ශ්‍රවණය කරන්න.
- එම ගීතයන් ගේ තාල රටාව සිහියට නගාගෙන කිහිප වරක් ගායනා කරන්න.
- නර්තන නිර්මාණය කිරීමේ දී රිද්මයානුකූල චලන, තාලානුකූල චලන, ප්‍රකාශනාත්මක චලන ආදී චලනයන්ගෙන් ඔබ කැමති චලන යොදා ගනිමින් නර්තන නිර්මාණය කළ හැකිය.

## <u>කාර්ය පත්‍රිකාව</u>

- **දිකිරි දිකිරි ගීතයෙන් ප්‍රශ්න**

1. මෙම ගීතය රචනා කලේ කවුද?
2. මෙම ගීතය කවුරුන් විසින් ගායනා කරන ලද්දක් ද?
3. මෙම ගීතයේ සංගීත නිර්මාණය කලේ කවුද ?
4. දිකිරි දිකිරි ගීතය ඇතුළත් වී ඇත්තේ කුමන නාට්‍යයේ ද?
5. මෙම ගීතය ගායනා කරන ලද තාලය කුමක්ද ?
6. මෙම ගීතයේ අර්ථය කෙටියෙන් විස්තර කරන්න.
7. මෙම ගීතය සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.
8. මෙම ගීතය අදහස ඉදිරිපත් වන අන්දමින් සුන්දර නර්තනයක් ඉදිරිපත් කරන්න.

- **රත්න දීප ජන්ම භූමි ගීතය ප්‍රශ්න**

9. රත්න දීප ජන්ම භූමි ගීතයේ පද රචනය කරන ලද්දේ කවුරුන් විසින්ද ?
10. මෙම ගීතය ගායනා කරන ලද්දේ කවුරුන් විසින්ද?
11. මෙහි සංගීත නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?
12. මෙම ගීතයෙන් ශ්‍රී ලංකාදීපයේ ස්වභාව සෞන්දර්ය වර්ණනා කිරීමට කවි පද රචකයා ගත් උත්සාහය කෙබඳු දැයි විස්තරයක් කරන්න.
13. මෙම ගීතය ගායනා කරන ලද තාල රූපය කුමක්ද?
14. එම තාල රූපය අවබෝධ කරගෙන එම ගීත ගායනා කරන්න.
15. සිංහල ජනතාවගේ උදාරතර මාතෘ භූමියේ සුන්දරත්වය ප්‍රේක්ෂකයාගේ හදවතට නැගෙන අයුරින් නර්තනයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.